# රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය
# பாதுகாப்பு மற்றும் நகர அபிவிருத்தி அமைச்சு
# Ministry of Defence and Urban Development






# 2013

## කාර්ය සාධන වාර්තාව
## சயெலாற்றகை அறிக்கை
## Performance Report

**අන්තර්ගතය**


1. පණිවිඩ
    - 1.1. අතිගරු ජනාධිපතිතුමාගේ පණිවිඩය
    - 1.2. රාජ්‍ය ආරක්ෂක ලේකම්තුමාගේ පණිවිඩය
2. හැඳින්වීම
3. දැක්ම හා මෙහෙවර
4. වගකීම් හා කාර්යභාර්යය
5. සංවිධාන සටහන
6. අමාත්‍යාංශය යටතේ වූ අංශ
    - 6.1 පරිපාලන අංශය
    - 6.2 ආරක්ෂක අංශය
    - 6.3 පොලිස් හා සිවිල් ආරක්ෂක අංශය
    - 6.4 සංවර්ධන අංශය
    - 6.5 පාර්ලිමේන්තු හා සිවිල් කටයුතු අංශය
    - 6.6 තාක්ෂණ අංශය
    - 6.7 නාගරික සංවර්ධන අංශය
    - 6.8 ගිණුම් අංශය
7. අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වූ ආයතනවල මූල්‍ය ප්‍රගතිය
    - 7.1 අමාත්‍යාංශය
    - 7.2 සන්නද්ධ හමුදා හා පොලිස් සුභසාධන අංශය
    - 7.3 'අපි වෙනුවෙන් අපි' නිවාස ව්‍යාපෘතිය
    - 7.4 'මිහිඳු සෙත් මැඳුර' ව්‍යාපෘතිය
    - 7.5 ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය
    - 7.6 ජාතික ශිෂ්‍යභට බලකාය
    - 7.7 ඒකාබද්ධ සේවා භාෂා පුහුණු මධ්‍යස්ථානය
    - 7.8 පොලිස් විශේෂ කාර්ය බලකාය
    - 7.9 පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
    - 7.10 ජාතික ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානය
    - 7.11 රාජ්‍ය බුද්ධි සේවාව

## ගරු ජනාධිපතිතුමාගේ පණිවිඩය



රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවට පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම පිළිබඳ සතුටට පත් වෙමි.

පසුගිය වර්ෂවලදී මෙන්ම ගෙවී ගිය වර්ෂයේදී ද ජාතික අවශ්‍යතාව හඳුනා ගනිමින් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය රට වෙනුවෙන් ලබා දෙන දායකත්වය ප්‍රසංසනීය ය. තස්ත්‍රවාදය නිමා වුවද රටේ ස්වෛරීභාවයට වූ බලපෑම අඩු වූයේ නැත. දේශිය මෙන්ම විදේශිය බලවේග විවිධ වේශයෙන් රටේ ස්වෛරීභාවයට තර්ජනයක් විය. ඒ සියල්ල මනාව හඳුනා ගනිමින් ඒ බලවේග මර්ධනය කිරීමට දුන් දායකත්වය ජාතියේ මහත් ආඩම්බරයට හේතුවනු නිසැක ය.

දශක තුනක් පුරා සංවර්ධනයේ මාවත් වසා දමා තිබු උතුරු නැගෙනහිර එල්.ටී.ටී.ඊය පාලනය යටතේ පැවති ගම් බිම් සංවර්ධනය වේගවත් කිරීමට හැකි වූයේ අමාත්‍යාංශය කළ දැවැන්ත කැප කිරීම් තුළිනි. එසේම නැවත පදිංචි කිරීම් මෙන්ම පුනරුත්තාපනය කටයුතු වලදී ද රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය ලබා දී ඇත්තේ මහත් දායකත්වයකි. වර්තමානයේ නාගරික සංවර්ධන ක්‍රියාවලිය ඉතා සැලසුම් සහගතව සිදු වෙයි. ජනතා අපේක්ෂා මෙන්ම ජාතික අවශ්‍යතා ලඝු නොකොට සිදු කරන ඒ වටිනා කාර්යභාරය ජනතාවගේ මහත් ප්‍රශංසාවට ලක්ව තිබේ. අඩු ආදායම්ලාභී ජනතාව වෙනුවෙන් නිවාස ඉදි කිරීම් සහ ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍ය හා අනෙකුත් සියලු අවශ්‍යතා හඳුනා ගැනීමට ද අමාත්‍යාංශය සමත් වී ඇත.

රට නිදහස් කර ගැනීමට දිවි හිමියෙන් කැප වූ රණවිරුවන් සදා ආරක්ෂා කිරීමත්, සිහි කිරීමත් අප ජාතියේ වගකීම ය. එසේම රණවිරු සුභසාධනය ලෝකයේ අන් කිසිදු රටකට නොදෙවෙනිව සිදු කිරීමටත් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය දැවැන්ත ශක්තියක් වී තිබේ.

රටේ සංවර්ධනය සැබෑ වන්නේ ඒ සමඟම රැකෙන සමාජ සාරධර්ම හා අගනාකම් නිසාය. මතට විරුද්ධව අප නීති රීති දැඩි කොට ඇත්තේ ද නිවුණු සැනසුන දේශයක් ගොඩ නැගීමට ය. ඒ වෙනුවෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය දැඩි අවධානය යොමු කොට තිබේ.

ජාතික ආරක්ෂාවත්, ජාතික සමගියත් රැක ගෙන ඓශ්වර්ය කරා පියවර තබන අප මාතෘ භූමිය වෙනුවෙන් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය ලබා දෙන සහයෝගය තව තවත් රට අපේක්ෂා කරයි. ඒ සඳහා කැපවන ආරක්ෂක ලේකම්තුමා ඇතුළු සියලුම නිළධාරීන්ට මාගේ ප්‍රණාමය පුද කර සිටිමි.

මහින්ද රාජපක්ෂ
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය

## ගරු ලේකම්තුමාගේ පණිවිඩය



මහින්ද චින්තන ඉදිරි දැක්ම යතාර්ථයක් කරනු උදෙසා සංවර්ධන ක්‍රියාදාමයේ පෙරගමන්කරුවන් ලෙසින් වර්තමානය තුළ රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය ඉටුකල කාර්යභාරය පිළිබඳව පසුවිපරමක් සිදුකිරීම අතිශයින්ම වැදගත් කටයුත්තකි.

පසුගිය වර්ෂය තුළ අමාත්‍යාංශයක් ලෙස ඊට අනුබද්ධ ආයතන හා රොද බැඳිව ලක්වැසි ජනයාගේ සුරක්ෂිතභාවය තහවුරු කරන අතරතුර පොදුජන මෙහෙවර උදෙසා කල කැපවීම් පිලිබඳ නිහතමානීව සතුටුවන අතර එයට දායක වූ සැමට ගෞරව පූර්වක ස්තුතියද පුද කරමි.

ජාත්‍යන්තරව හා දේශීයව එල්ලවන විවිධ බාධක හා තර්ජනයන් හමුවේ වුවද සංවර්ධන ක්‍රියාවලිය තුළ සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරමින් තිරසාර සංවර්ධනයක් භෞතිකව මෙන්ම චින්තනාත්මකව සපුරාලීමට අපට හැකිවීම සුවිශේෂී වේ. අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්ත්වයද නංවාලමින් ඔවුන්ගේ මූලික අවශ්‍යතා සුරක්ෂිත කිරීමට නාගරික සංවර්ධනයේදී ප්‍රමුඛව අප කටයුතු කළෙමු. හරිත නගරයක, ක්‍රමවත් සැලැස්මකට ඒ සැම කටයුත්තක්ම අපි සිදු කළෙමු. අද වනවිට එම කටයුතු හි ප්‍රතිලාභය ජනතාව භුක්තිවිඳින අන්දම මෙරටට පැමිණෙන්නන්ට මෙන්ම විවේචන සිදුකරන කවරෙකුට වුවද සියැසින්ම දැකගත හැකිවනු ඇත.

රටක සාමාජීය, ආර්ථික හා සංස්කෘතික වශයෙන් ඇතිවන දියුණුව එරට සංවර්ධනයේ කැඩපත වනු ඇත. එවන් ක්‍රියාවලියකට දායක වෙමින් ඉදිරියේදී වගකීමෙන් යුතු කාර්යභාරයක් ඉටුකිරීම අමාත්‍යාංශයේ හා ඊට අනුබද්ධ ආයතනයන්හි සියලු කාර්යමණ්ඩලවලට හැකියාව හා ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන අතර, අද බිහිකරන සුවබර රට මතු පරපුරට උරුම කරමින් තිරසාර සංවර්ධනය තහවුරු කරන්නට හැකි වේවායි පතමි.


ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්ලිව්පි,ආර්එස්පි,පිඑස්සි

ලේකම්

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන

අමාත්‍යාංශය

# පසුබිම

රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය 1948 දී ආරම්භ කළ අතර, එහි කාර්ය මණ්ඩලය සමන්විත වූයේ ප්‍රධාන ලේකම්තුමාගේ සහ ආණ්ඩුකාරතුමාගේ කාර්ය මණ්ඩලයෙනි. යුධ හමුදා පනත (357 වන අධිකාරය) නාවික හමුදා පනත (368 වන අධිකාරය) සහ ගුවන් හමුදා පනත (359 වන අධිකාරය) මඟින් ස්ථාපිත කරන ලද යුධ හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව මෙම අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතට පත් විය. ආරක්ෂක හා අභ්‍යන්තර කටයුතු ද මෙම අමාත්‍යාංශය යටතට පැවරුණි.

පොලිස් දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ ඉන්දියානු හා පකිස්තාන ජාතිකයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව යනාදී ආයතනද මෙම අමාත්‍යාංශය යටතේ පාලනය විය. 1971දී පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව ද මෙම අමාත්‍යාංශයට අනුයුක්ත කර ගන්නා ලදි.

ජාතික ආරක්ෂාව වඩ වඩාත් තහවුරු කිරීම අරමුණු කරගෙන, 1977 ජූලි මස විදේශ කටයුතු විෂය ආරක්ෂක අමාත්‍යාංශයෙන් වෙන් කර විදේශ කටයුතු අමාත්‍යාංශය ස්ථාපිත කල අතර එවක පටන් සුළු කාලයක් හැරෙන්නට රාජ්‍ය  ආරක්ෂක අමාත්‍ය ධූරය ජනාධිපතිවරයා විසින් දරනු ලැබීය.

2006.02.20 දිනැති අංක 1433/11 අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව ස්ථාපිත කරනු ලැබූ අභ්‍යන්තර පරිපාලන අමාත්‍යාංශය යටතට ආගමන විගමන දෙපාර්තමේන්තුව සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව පත්කල නමුත් 2010.04.30 දිනැති අංක 1651/20 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව එකී දෙපාර්තමේන්තු ද්විත්වය නැවත වරක් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ අධීක්ෂණයට නතු විය.

දශක තුනක් මුළුල්ලේ මාතෘභූමිය වෙලාගෙන පැවති කුරිරු ත්‍රස්තවාදය මුලිනුපුටා දමා ශ්‍රී ලාංකිකයන්ට සාමය උදා කර දීමෙත් සමඟ 2010 නොවැම්බර් 22 දිනැති අංක 1681/03 අති විශේෂ ගැසට් නිවේදනයට අනුව නාගරික සංවර්ධන විෂය පථය පිළිබඳ වගකීමද පවරමින් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය ලෙස නම් කරනු ලැබීය.

මේ වන විට රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ කටයුතු වඩාත් කාර්යක්ෂම හා පහසු කිරීම සඳහා මෙම අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පැවති පොලිස් දෙපාර්තමේන්තුව 2013.08.16 දිනැති අංක 1823/70 දරන අති විශේෂ ගැසට් නිවේදනය මඟින් නීතිය හා සාමය අමාත්‍යාංශයේ අධීක්ෂණයට ලක් කරනු ලැබ ඇත.

ජාතික ආරක්ෂාවට ජාත්‍යන්තර හා අභ්‍යන්තර වශයෙන් එල්ලවන තර්ජනයන්ට මුහුණ දෙමින් ආසියාවේ ආශ්චර්යය බවට අප මාතෘභූමිය පත්කර සාමය සුරැකි සුවබර රටක් නිර්මාණය කිරීමේ භාරදූර කාර්යයට ප්‍රමුඛ දායකත්වයක් ලබා දීමේ ජාතික අවශ්‍යතාවය  රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය ඉදිරියේ පවතී. මෙම කාර්යයේදී නාගරික සංවර්ධනය හා අපද්‍රව්‍ය කළමනාකරණයට සහයවීම, ජල ගැලීම් හා ගංවතුර පාලනය, මත්ද්‍රව්‍ය නිවාරණය වැනි විවිධ අංශ හරහා කැපී පෙනෙන දායකත්වයක් ලබා දෙමින් සිටී.

## දැක්ම

සැම සුරැකි සුවබර රටක්

## මෙහෙවර

භෞමික අඛණ්ඩතාවයෙන් යුත් සුරක්ෂිත ස්වෛරී රටක්, ධරණීය නාගරික පරිසරයක්,

තරඟකාරි ආර්ථිකයක් සහ උසස් ජීවන තත්වයක් තහවුරු කිරීම උදෙසා

උපායමාර්ගික සැලසුම් හා ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාවට නැංවීම.

# 4. අමාත්‍යාංශයේ කාර්යයන් හා වගකීම්

1. මහින්ද චින්තන ඉදිරි දැක්ම සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා රාජ්‍ය ආරක්ෂාව, නීතිය හා සාමය පවත්වාගෙන යාම, නාගරික සංවර්ධනය, ඉඩම් ගොඩකිරීම හා සංවර්ධනය, පුරවැසි භාවය පිළිබඳ විෂයයන්ට හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම.
2. අදාළ අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම් බලධාරීන් සමඟ එකඟත්වයට පැමිණි කාල සීමාව හා අයවැය ගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම.
3. අමාත්‍යාංශ විෂය පථයට අයත් වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.
4. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ තාක්ෂණික ශිල්පීය ක්‍රම යොදා ගනිමින් සියළුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
5. සන්නද්ධ සේවාවන්හි ක්‍රියාකාරිත්වය සඳහා පහසුකම් සැලසීම තුලින් රටේ ආරක්ෂාව තහවුරු කිරීම.
6. රටේ අභ්‍යන්තර ආරක්ෂාව පවත්වාගෙන යාම
7. රටේ ආරක්ෂාව හා අභ්‍යන්තර සුරක්ෂිතතාවය හා සම්බන්ධව බුද්ධිමය සේවාවන් පවත්වාගෙන යාම.
8. නීතිය හා සාමය පවත්වාගෙන යාම.
9. ආගන්තුක සන්නද්ධ සේවාවන් සමඟ සම්බන්ධතා පැවැත්වීම.
10. රණවිරුවන් හා ආබාධිත සෙබළුන් හා සම්බන්ධ කටයුතු.
11. පුපුරණ ද්‍රව්‍ය හා ගිණිඅවි.
12. ප්‍රදීපාගාර නඩත්තු කිරීම.(වරාය අධිකාරයට අයත් ඒවා හැර අනිත් ප්‍රදීපාගාර)
13. ආරක්ෂක සේවාවන් හා සම්බන්ධ පුද්ගලයින් හට ආරක්ෂක අධ්‍යාපනය හා පශ්චාත් සේවා අධ්‍යාපනය ලබා දීම.
14. ආරක්ෂක සේවා පුද්ගලයින් හට උසස් අධ්‍යාපනය ලබා දීම.
15. පුද්ගලික ආරක්ෂක සේවා හා සම්බන්ධ කටයුතු.
16. පුද්ගලයින් ලියාපදිංචි කිරීම.
17. ආගමනය හා විගමනය සම්බන්ධ කටයුතු.
18. ශ්‍රී ලාංකික පුරවැසිභාවය ප්‍රදානය කිරීම හා විදේශගත අපරාධකරුවන් නැවත භාරදීම සම්බන්ධයෙන් වන කටයුතු.
19. අන්තරාදායක ඖෂධ පාලනය කිරීම.
20. නාගරික ප්‍රදේශයන්හි ආර්ථික, සමාජීය සහ භෞතික සංවර්ධනය ප්‍රවර්ධනය කරනු වස් රෙගුලාසි සහ සැලසුම් සකස් කිරීම.
21. ඉඩම් ගොඩකිරීම හා සංවර්ධනය කිරීම.
22. වෙරළ ආරක්ෂක සේවාවේ මුදවා ගැනීමේ මෙහෙයුම් සහ පරිපාලන කටයුතු.
23. වෙරළ සංරක්ෂණය හා ආරක්ෂණය.
24. අමාත්‍යාංශය යටතට ගැනෙන සංවිධානයන්හි සමස්ථ විෂය කටයුතු.
25. අමාත්‍යාංශය යටතේ ඇති සංවිධානයන් අධීක්ෂණය කිරීම.

# 5. රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ සංවිධාන සටහන




අංක 1823/70 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 2013.08.16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව නීතිය හා සාමය අමාත්‍යාංශය යටතට ගන්නා ලදී. ඒ අනුව අතිරේක ලේකම් (පොලිස්) හා ඒ යටතේ වූ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, සහකාර ලේකම් ලෙස අනුමත තනතුරු 03ක් අමාත්‍යාංශයෙන් ඉවත් වේ.අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 14/0073/503/004 හා 2014.01.26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2013.12.01 දින සිට ජාතික ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානය අහෝසි කරන ලද අතර ඒ අනුව ජාතික ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරද අහෝසි වේ.

# 6. අමාත්‍යාංශයේ කාර්යයන් ඉටු කරන අංශ

## 6.1 පරිපාලන අංශය

පරිපාලන අංශයේ වගකීම් දරණ ප්‍රධාන ක්ෂේත්‍රයන් පහත සඳහන් ආකාරයට සාරාංශ කර දැක්විය හැක.

- අමාත්‍යාංශයේ හා ඒ යටතේ වූ පහත සඳහන් ආයතනයන්හි ආයතනික හා පරිපාලන කටයුතු හා නඩත්තු කටයුතු සිදුකිරීම
  - ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය
  - ජාතික ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානය
  - රාජ්‍ය බුද්ධි සේවාව
  - ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය
  - සන්නද්ධ හමුදා හා පොලිස් සුභසාධන අංශය
  - ප්‍රජා පොලිස් සුරකිමු ලංකා ජාතික සිවිල් ආරක්ෂක සම්බන්ධීකරණ මූලස්ථානය

- මෙම අමාත්‍යාංශයේ හා ඒ යටතේ ඇති පහත සඳහන් ආයතනයන්හි සිවිල් නිළධාරීන් හා සේවකයින් පිළිබඳ ආයතනික හා පරිපාලන කටයුතු.
  - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
  - ශ්‍රී ලංකා නාවික හමුදාව
  - ශ්‍රී ලංකා ගුවන් හමුදාව
  - ශ්‍රී ලංකා පොලිසිය
    (අංක 1823/70 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 2013.08.16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව නීතිය හා සාමය අමාත්‍යාංශය යටතට පවරන ලදී.)
  - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
  - පොලිස් විශේෂ කාර්ය බලකාය
  - පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
  - වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව
  - සන්නද්ධ හමුදා හා පොලිස් සුභසාධන අංශය
  - ජාතික ශිෂ්‍යභට බලකාය
  - වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
  - ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය
  - ජාතික ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානය
  - රාජ්‍ය බුද්ධි සේවාව
  - සන්නද්ධ හමුදා හා පොලිස් සුභසාධන අංශය
  - රාජ්‍ය ආරක්ෂක ලේකම්තුමාගේ නිල නිවස

- අමාත්‍යාංශය යටතේ වූ පහත සඳහන් ආයතනයන්හි පරිපාලන කටයුතු හා ප්‍රතිපත්ති තීරණ ගැනීම්, මූල්‍යමය කටයුතු සම්බන්ධව ක්‍රියා කිරීම මෙම අංශය මඟින් සිදු කරයි.
  - ‘අපි වෙනුවෙන් අපි’ නිවාස ව්‍යාපෘතිය
  - ‘මිහිඳු සෙත් මැඳුර’ ව්‍යාපෘතිය

- අමාත්‍යාංශයේ සියලුම අභ්‍යන්තර අංශයන්හි පරිපාලන කටයුතු සිදු කරන අතර තැපැල් අංශය, ප්‍රවාහන අංශය, පරිපාලන අංශය යටතේ පාලනය වේ.

- මානව සම්පත් සංවර්ධන වැඩසටහන්
    - රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය තුල සේවය කරනු ලබන නිළධාරීන්ගෙන් ඉහල කාර්යක්ෂමතාවයක් හා ඵලදායීත්වයක් ලබාගැනීමටත් පුද්ගල ඵලදායීත්වය හා අභිප්‍රේරණය ඉහල නැංවීමත් අරමුණු කොට ගෙන විවිධ පුහුණු වැඩසටහන් මෙහෙයවීම හා රාජ්‍ය අංශයේ පුහුණු පාඨමාලාවන් මෙහෙයවනු ලබන ආයතනයන් වෙත විවිධ පාඨමාලාවන් සඳහා මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිළධාරීන් යොමු කිරීමත්, එම පාඨමාලාවන් හැදෑරීමට අවශ්‍ය පහසුකම් ලබාදීමත් කටයුතු කරයි.
    - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, ඵලදායිතා ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා පදනම,රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව ආදී ආයතන මෙහෙයවනු ලබන විවිධ පාඨමාලාවන් 60 ක් සඳහා මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිළධාරීන් 150කට ආසන්න ප්‍රමාණයක් මෙම වර්ෂය තුලදී සහභාගී කරවා ඇත.
- තවද නව රැකියා පොළට පිවිසෙන තරුණ තරුණියන්ගේ කුසලතාවයන් ඉහල තලයකට පත් කිරීම සඳහා මෙම අමාත්‍යාංශය වෙතින් ලබාදෙනු ලබන දායකත්වයක් ලෙස ජාතික ආධුනිකත්ව මණ්ඩලය, ජාතික තරුණ සේවා සභාව හා තාක්ෂණ විද්‍යාල ආදී රාජ්‍ය ආයතන මඟින් වසර පුරාවට වරින් වර යොමු කරන ලද අභ්‍යාසලාභී පුහුණුවන්නන් 60 දෙනෙක් සඳහා පරිගණක කටයුතු හා කාර්යාල ක්‍රම ආශ්‍රිත රැකියා පාදක කොට ගත් මාස 06 ක පුහුණුවක් ලබාදීමටත්, පුහුණු කටයුතු කරගෙන යාමේදී ඔවුන්ට අවශ්‍ය මඟපෙන්වීම් ලබාදීමටත් කටයුතු කරන ලදී.
- ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ නීතිමය පියවර ගැනීම, ශ්‍රී ලංකා රජය සහ වෙනත් රාජ්‍යයන් අතර ඇතිවන අවබෝධතා ගිවිසුම්වලදී ආරක්ෂක අමාත්‍යාංශය සම්බන්ධයෙන් වන ගිවිසුම් වලට අවශ්‍ය නීතිමය තොරතුරු ලබාදීම, ඉපලෝගම නිවාස ව්‍යාපෘතිය, රණවිරු රියල්ස්ටාර් වැනි විශේෂ ව්‍යාපෘති, ඔප්පු, ගිවිසුම් සකස්කර දීම සහ අවශ්‍ය නීතිමය උපදෙස් ලබා දීම, අමාත්‍යාංශයට හා ඒ යටතේවූ ආයතනවලට අවශ්‍ය නීතිමය උපදෙස් ලබාදීම, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධවී රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට බලපාන නීති අණපනත් සංශෝධනය කිරීමේදී සහයෝගය ලබාදීම, ආදී කටයුතු මෙම අංශය යටතේ පාලනය වන නීති අංශය මඟින් සිදු කරනු ලැබේ.
- මෙම අංශයේ අධීක්ෂණය යටතේ අමාත්‍යාංශයේ නඩත්තු කටයුතු ඉංජිනේරු අංශය විසින් සිදු කරන අතර 2013 වර්ෂයේ අම්පාර ප්‍රදේශයේ පැවති දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය සඳහා මෙම අමාත්‍යාංශය වෙතින් හා අනුබද්ධිත ආයතන වෙතින් ප්‍රදර්ශනය කරන ලද ප්‍රදර්ශන කුටි ඉතා අලංකාරවත් අන්දමින් නිර්මාණය කර ජනතාවට නැරඹීම සඳහා ඉදිරිපත් කර විශේෂ දායකත්වයක් ලබා දෙන ලදී. පරිපාලන අංශය විසින් අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

## 6.2 ආරක්ෂක අංශය

ත්‍රිවිධ හමුදාවන්ට අදාළ සියලුම ආයතනික කටයුතු සිදු කරනු ලබන්නේ මෙම අංශය මඟිනි.

**කාර්යයන්**

- ත්‍රිවිධ හමුදාවලට නිලධාරීන් බඳවා ගැනීම හා අධිකාරියට පත් කිරීම , උසස් කිරීම,සේවා දිගු ලබා දීම සහ අධිකාරියෙන් ඉවත් කිරීම.

| හමුදාව | නිලධාරීන් බඳවා ගැනීම් සංඛ්‍යාව | නිලධාරි උසස්වීම් |
|---|---|---|
| යුද්ධ හමුදාව | 345 | 714 |
| නාවික හමුදාව | 098 | 260 |
| ගුවන් හමුදාව | 172 | 251 |

- ත්‍රිවිධ හමුදා පනත් හා රෙගුලාසිවල කාලෝචිත සංශෝධන සිදු කිරීම.
- ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටිය දී මියගිය හා අබාධිත ත්‍රිවිධ හමුදා පුද්ගලයින්ට හා පවුල්වල අයට වන්දි මුදල් ගෙවීම සඳහා නිර්දේශ ලබා දීම.

| | යුධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව |
|---|---|---|---|
| ක්‍රියාන්විතයේදී මිය ගිය අයගේ යැපෙන්නන් වෙනුවෙන් වන්දි මුදල් ගෙවීම් | 45 | 5 | - |
| අසාමාන්‍ය හේතූන් මත මිය ගිය අයගේ යැපෙන්නන් වෙනුවෙන් වන්දි මුදල් ගෙවීම් | 76 | 6 | 8 |
| අසාමාන්‍ය හේතූන් මත මිය ගිය අයගේ යැපෙන්නන් වෙනුවෙන් වැටුප් හා දීමනා ගෙවීම් | 27 | 8 | 1 |
| ආබාධිත අයට හිමි වන්දි මුදල් ගෙවීම් | 102 | 320 | 15 |
| වැන්දඹුවන් නැවත විවාහයෙන් පසු බිරිඳට ගෙවීම් | 110 | 16 | - |
| වයස අවුරුදු 26 වන තෙක් දරුවන්ට වැටුප් හා දීමනා ගෙවීම් | 30 | 01 | - |
| ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිත වූ අයට වයස අවු .55 වනතෙක් වැටුප් / දීමනා ගෙවා විශ්‍රාම යැවීම් හා වන්දි මුදල් ගෙවීම් | 570 | 12 | 01 |

- ත්‍රිවිධ හමුදාවේ සියළුම නිලයන් රට වෙනුවෙන් කල සේවය අගය කරනු වස් පදක්කම් හා සන්ධාර ප්‍රදානය කිරීම.

- ත්‍රිවිධ හමුදාවේ සියළුම නිලයන් රට වෙනුවෙන් කල සේවය සමරනු වස් 2012 /2013 වසරවල් තුල පහත පරිදි පදක්කම් ප්‍රදානය කර ඇත.

| පදක්කමේ නම | | යුධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව |
|---|---|---|---|---|
| දීර්ඝ සේවා සන්නද්ධ සේවා පදක්කම | | 3591 | 220 | 1091 |
| දේශ පුත්‍ර සම්මානය | | - | 7 | - |
| විදේශ සේවා පදක්කම | | - | 76 | - |
| වීර ක්‍රියා | පරම වීර විභූෂණය | 06 | - | - |
| | විරෝධාර විභූෂණය | 03 | 03 | - |
| | වීර වික්‍රම විභූෂණය | 98 | 20 | 37 |
| | රණ වික්‍රම විභූෂණය | 13262 | 97 | 203 |
| | රණ ශූර පදක්කම | 16407 | 2364 | 309 |
| එක්සත් ජාතීන්ගේ සාම සාධක | | - | - | 45 |
| ප්‍රශංසනීය සේවා | | - | 30 | - |
| කාර්යක්ෂම සේවා පදක්කම් | | 6 | - | - |

- ත්‍රිවිධ හමුදාවට අදාලව ජනතාවගෙන් දෛනිකව ලැබෙන ලිපි ප්‍රමාණය වෙනුවෙන් නිසි පියවර ගැනීම.
  මෙම වර්ෂය තුළ විවිධ පුද්ගලයින්ගෙන් ලද දුක්ගැනවිලි 3000 ක පමණ ප්‍රමාණයක් නිසි පියවර සඳහා අදාල ආයතන වෙත යොමු කර ඇත.

- ජාතික හා අන්තර්ජාතික ක්‍රීඩා සඳහා සහභාගි වන ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන්ට අවශ්‍ය ආයතනික කටයුතු සම්පාදනය

- ජාතික ආරක්ෂක අරමුදල පිළිබඳ පරිපාලන කටයුතු

  මෙම අරමුදල් යොදවා 2012 වසරේ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සමත් රණවිරු පවුල්වල දරුවන් සඳහා ශිෂ්‍යත්ව 149 ක් ප්‍රදානය කොට ඇති අතර , එහි වටිනාකම රු. ලක්ෂ 3,848,832,24 කි.

- ත්‍රිවිධ හමුදා සඳහා වන විදේශ පුහුණු පාඨමාලා පිළිබඳ කටයුතු

  - විදේශීය රටවල පැවැත්වෙන සම්මන්ත්‍රණ/සමුළු/වැඩසටහන් හා විදේශ සංචාර සඳහා සහභාගී වීමට ත්‍රිවිධ හමුදාව වෙත අවස්ථා 92ක් ලබා දී ඇත.
  - ජාතික අරක්ෂක විද්‍යා පීඨ සඳහා අබෑර්තු පාඨමාලා 16ක් ද, මාණ්ඩලික පාඨමාලා 17ක් ද ත්‍රිවිධ හමුදා වෙත ලබා දී ඇති අතර,චීනයෙන් පාඨමාලා 53 ක් ලබා දී ඇත.
  - ඉන්දියාව,බංගලාදේශය,පාකිස්ථානය හා මැලේසියාව යන රටවලින් වාර්ෂිකව ලබා දෙන ඇබෑර්තු වෙනුවෙන් ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහභාගි කරවා ඇත.
  - විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් පාඨමාලා 102 ක් ලබා දී ඇත.
  - චීනය, මැලේසියාව, ඉන්දියාව, පාකිස්ථානය,බංගලාදේශය,නේපාලය,ඉන්දුනීසියාව සහ මාලදිවයින යන රටවල හමුදා පුද්ගලයින් වෙනුවෙන් මෙරට ත්‍රිවිධ හමුදාවලට අයත් පුහුණු ආයතන වලින් පුහුණු පාඨමාලා ලබා දී ඇත.

- විදේශ දූත මණ්ඩල සඳහා ආරක්ෂක උපදේශකවරුන් හා බුද්ධි නිලධාරීන් පත් කිරීම හා ඔවුන්ගේ පරිපාලනමය කටයුතු

- එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවේ සහ යුධ නිරීක්ෂකයන් ලෙස ත්‍රිවිධ හමුදාවේ හා පොලීසියේ පිරිස් යෙදවීම

  2013 සැප්තැම්බර් මස වන විට යුධ නිරීක්ෂකයන් හා සාම සාධක හමුදාවේ රාජකාරි කටයුතු සඳහා පහත සඳහන් පරිදි නිලධාරීන් යොදවා ඇත.2013 මුල් කාර්තු තුන තුළ එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරි වලින් US $ 12,997,338.76 පමණ මුදලක් විදේශ විනිමය වශයෙන් මෙරටට ලැබී ඇත.

| | යුධ | නාවික | ගුවන් | පොලීසිය | එකතුව |
|---|---|---|---|---|---|
| හයිටි | 762 | 44 | 44 | 14 | 874 |
| ලෙබනන් | 151 | - | - | - | 151 |
| කොන්ගෝ | 6 | - | - | - | 6 |
| ලයිබීරියා | - | - | - | 14 | 14 |
| සුඩාන් | 2 | - | - | 18 | 20 |
| එකතුව | 921 | 44 | 44 | 46 | 1065 |

- ජාතික ශිෂ්‍යභට බලකායෙහි ප්‍රතිපත්තිමය හා ආයතනික කටයුතු

- වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් ප්‍රතිපත්තිමය ආයතනික කටයුතු.

# 6.3 පොලිස් හා සිවිල් ආරක්ෂක අංශය

- මෙම අංශය විසින් අමාත්‍යාංශය යටතේවූ පහත සඳහන් ආයතනයන්හි ආයතනික හා පරිපාලන කටයුතු සඳහා දායක වීම
    - පොලිස් දෙපාර්මේන්තුව
      (අංක 1823/70 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2013.08.16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව නීතිය හා සාමය අමාත්‍යාංශය යටතට පත්කරන ලදී)
    - පොලිස් විශේෂ කාර්ය බලකාය
    - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
    - අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

- **තුවක්කු ආඥා පනත ක්‍රියාත්මක කිරීම.**

රටේ ඇතිවී තිබෙන යහපත් වාතාවරණය සැලකිල්ලට ගෙන තවදුරටත් සිවිල් පුද්ගලයන් වෙත ගිනිඅවි නිකුත් කිරීම දැඩි ලෙස පාලනයට ලක් කෙරිණ. වගා ආරක්ෂාව/සත්ව පාලනය වෙනුවෙන් ගිනිඅවියක අවශ්‍යතාවය බෙහෙවින්ම ඇති පුද්ගලයින්ට පමණක් ගිනිඅවි ලබා දීමට අවශ්‍ය විධි විධාන සලසන ලදි. ඒ අනුව අදාල කාල පරිච්ඡේදය තුළ පහත සඳහන් පරිදි ගිනි අවි නිකුත් කර ඇත.

| | |
|---|---|
| කෘෂිකාර්මික කටයුතු සඳහා ගිනි අවි (තුවක්කු)නිකුත් කිරීම | - 160 |
| පෞද්ගලික ආරක්ෂාව (දේපල හා ජීවිත ආරක්ෂාව) සඳහා ගිනි අවි නිකුත් කිරිම | - 57 |
| රාජ්‍ය හා පුද්ගලික ආයතන සඳහා ගිනි අවි නිකුත් කිරීම | - 27 |
| රාජ්‍ය හා පුද්ගලික බැංකු සඳහා ගිනි අවි නිකුත් කිරීම් | - 338 |
| අවුරුදු 65 වයස් සීමාව ඉක්මවූ ගිනිඅවි හිමිකරුවන්ගේ පවුල තුළ සිදු කෙරෙන ගිනිඅවි පැවරීම | - 227 |

- **පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යාතන විධිමත් කිරීමේ පනත.**

දිවයින පුරා ක්‍රියාත්මක සියලු පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතනයන්හි ආරක්ෂක නිලධාරීන් සඳහා ඒකීය අනන්‍යතාවයකින් යුත් නව නිල ඇඳුමක් 2011.03.09 දින හඳුන්වා දී ඇති අතර වර්තමානයේ සියලුම පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන එම නිල ඇඳුම භාවිතා කරනු ලබයි. නීති විරෝධීව ආරක්ෂක ආයතන පවත්වාගෙන යන පුද්ගලයන් පිළිබඳව තොරතුරු දන්වන ලෙස මාධ්‍ය මගින් දැනුවත් කෙරිණ. ඒ අනුව ලැබුණු තොරතුරු අනුව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි වී නොමැති ආයතන 25කට අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇත. පෞද්ගලික ආරක්ෂක ආයතන විමර්ශනය කිරීමේ විශේෂ පොලිස් කණ්ඩායමක් ස්ථාපිත කර ඇති අතර, දිවයින පුරා ක්‍රියාත්මක සෑම පෞද්ගලික ආරක්ෂක ආයතනයක්ම මෙම ඒකකය මගින් නිරන්තර පරීක්ෂා කිරීම් වලට භාජනය කරන ලදි.

- **පුපුරණ ද්‍රව්‍ය පනත ක්‍රියාත්මක කිරීම.**

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ නියෝගය පරිදි දිස්ත්‍රික්ක 19ක ජනතාව ගැවසෙන ස්ථාන වලින් බැහැර වූ ආරක්ෂක ප්‍රදේශයන්හි අවශ්‍ය වාණිජ පුපුරණ ද්‍රව්‍ය ගබඩා 30 ක ඉදි කිරීම් කටයුතු මේ වන විට නිමකර ඇත. අළුතින් ප්‍රතිස්ථානගත කරන ලද පළමු වාණිජ පුපුරණ ද්‍රව්‍ය ගබඩාව අම්පාර දිස්ත්‍රික්කයේ නවගම්පුරදී විවෘත විය. ඉතිරි ගබඩාවන්ද කඩිනමින් ඉදිකර මේ වසරේ අවසන් කරනු ඇත.ඉන්දියන් සාගරය හරහා ගල්ෆ් රටවලට යාත්‍රා කරන විදේශ නැව් වලට නෞකා ආරක්ෂක සේවා ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර නැව් සමාගම් හා ආරක්ෂක සමාගම් මගින් කරන ඉල්ලීම් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ගාලු වරාය සේවා සපයන අතර එසේ සේවා ලබා ගැනීමට පැමිණෙන නැව් සඳහාද අවසර ලබාදීම මෙම අංශයෙන් සිදුකෙරේ.

වසර 12කින් පමණ සංශෝධනයක් සිදුනොවූ පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර/බලපත්‍ර වල ගාස්තු කාලානුරූපීව සංශෝධනයක් සිදු කිරීම පිළිබඳව අවධානය යොමු කිරීම.

- **ඩෙංගු රෝග මර්ධන වැඩසටහන**

ශ්‍රී ලංකාව පුරාම ඩෙංගු රෝගය උත්සන්න වී දරුණු වසංගතයක් බවට පත්වීම නිසා ඩෙංගු උවදුර මර්දනය කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන් තවදුරටත් ශක්තිමත් කිරීම සහ නීතිය තදින් බලාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව එම කාර්යයන් ඉටු කිරීමට කටයුතු කිරීම.

## 6.4 සංවර්ධන අංශය

මෙම අංශය විසින් අමාත්‍යාංශය යටතේ වූ පහත සඳහන් ආයතනයන්හි ආයතනික හා පරිපාලන කටයුතු සඳහා සංවර්ධන ක්‍රියාවලීන්හි වගකීම් දරණු ලබයි.

- කොතලාවල ආරක්ෂක විද්‍යාලය
- ජාතික මානව හිමිකම් ආරක්ෂා කිරීමේ ජාතික සැලැසුම හා බිම් බෝම්බ ඉවත් කිරීමේ ජාතික සැලැසුම හා සම්බන්ධ සංවර්ධන ක්‍රියාවලීන්
- ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය කොත්මලේ
- ආරක්ෂක සේනා අණ සහ මාණ්ඩලික විද්‍යාලය
- ආරක්ෂක සේවා විද්‍යාලය
- රණවිරු දරුවන් (ක්‍රියාන්විත) ජාතික හා ජනප්‍රිය පාසැල් වලට ඇතුලත් කිරීම
- රණවිරු සේවා අධිකාරිය

සන්නද්ධ සේවා වල නියුතු වූවන්ගේ දරුවන් රජයේ පාසැල් හා ආරක්ෂක විද්‍යාලය වෙත ඇතුලත් කිරීම

| රජයේ පාසැල් | | | | ආරක්ෂක සේවා විද්‍යාලය | | | |
|---|---|---|---|---|---|---|---|
| යුධ | ගුවන් | නාවික | පොලිස් | යුධ | ගුවන් | නාවික | පොලිස් |
| 6209 | 1470 | 1823 | 2357 | 108 | 24 | 33 | 53 |

**මානව හිමිකම්**

ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම තුළ ත්‍රිවිධ හමුදාව,පොලිස් දෙපාර්තමේන්තුව,ආගමන විගමන දෙපාර්තමේන්තුව සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට වන යෝජනා ක්‍රියාත්මක කර ඇත.ඒ අනුව ශ්‍රී ලංකාව තුළ මානව හිමිකම් ආරක්ෂා කිරිම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා අදාල අංශයන් සමඟ සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මඟින් සිදු කරනු ලැබේ.

**බිම් බෝම්බ ඉවත් කිරීම**

මෙම වැඩසටහන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක කරන අතර මේ සඳහා භාවිතා කරන උපකරණ ආනයනය හා අපනයනය සම්බන්ධයෙන් අවශ්‍ය අනුමැතිය ලබා දීම සහ අනෙකුත් අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු මෙම අංශයෙන් සිදු කරනු ලැබේ.

## 6.5 පාර්ලිමේන්තු හා සිවිල් කටයුතු අංශය

- මෙම අංශය විසින් අමාත්‍යාංශය යටතේවූ පහත සඳහන් ආයතනයන්හි ආයතනික හා පරිපාලන කටයුතු සඳහා දායක වීම
  - ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ආයතනික කටයුතු
  - පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කටයුතු

- **ත්‍රිවිධ හමුදාවන්ට ඉඩම් ලබා දීම.**

- ත්‍රිවිධ හමුදාවේ නව ඒකකයක් පිහිටුවීම සඳහාත් දැනට තිබෙන ඒකකයන් පුළුල් කිරීම සඳහාත් අවශ්‍ය වන රාජ්‍ය හා පෞද්ගලික අංශයට අයත් ඉඩම්, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව හා ඉඩම් අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය වී හමුදාවට ලබා දීම සහ අත්පත් කර ගැනීම් වලදී අදාල වන්දි ගෙවීම් කටයුතු කිරීම.

- ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ට පදිංචිය සඳහා නිවාස තනා ගැනීමට අවශ්‍ය ඉඩම් කැබලි, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, මහවැලි අධිකාරිය, ප්‍රාදේශීය ලේකම්වරුන් වෙතින් ලබා ගැනීමටද, මේ සඳහා අවශ්‍ය නිර්දේශ අදාල සේවාවන්හි සුභසාධන අධ්‍යක්ෂවරුන් වෙතින් ලබා ගෙන සුදුසු අය සඳහා ඉඩම් ලබා දීමද, විශේෂිත කාර්යයන් සඳහා ඉඩම් ලබා දීමද (රණවිරු ගම්මාන වැනි) මෙම අංශය මගින් සිදුකරනු ලැබේ.

| | යුද හමුදාව | ගුවන් හමුදාව | නාවික හමුදාව |
|---|---|---|---|
| ඉඩම් අත්පත් කර ගැනීමේ සංඛ්‍යාව ප්‍රමාණය | අක්කර 8745 රූඩ් 02 පර්:26 | අක්කර 06 රූඩ් 01 පර්:02 | අක්කර - |
| රජයේ ඉඩම් පවරා ගැනීමේ සංඛ්‍යාව ප්‍රමාණය | අක්කර 11747 රූඩ් 03 පර්:23 | අක්කර 00 රූඩ් 00 පර්චස් 20 | අක්කර 37 රූඩ් 02 පර්චස් 28 |
| ගොඩනැගිලි | - | - | - |

- **පාර්ලිමේන්තු කටයුතු**

  - ත්‍රිවිධ හමුදාව හා පොලීසිය ඇතුළු මෙම අමාත්‍යාංශය යටතට අයත් දෙපාර්තමේන්තු හා ආයතන සම්බන්ධව මහජනයා විසින් පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කරනු ලබන පෙත්සම් සඳහා අවශ්‍ය විස්තර ලබා ගෙන පිළිතුරු සකස් කොට මහජන පෙත්සම් කාරක සභාව වෙත යොමු කිරීම.

- කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව පවත්වාගෙන යනු ලබන දේශීය රෙදිපිළි වෙන් කර දීමේ කටයුතු මගින් ත්‍රිවිධ හමුදා, පොලිස් දෙපාර්තමේන්තුව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව හා ජාතික ශිෂ්‍ය භට බලකාය සඳහා නිල ඇඳුම් හා අනෙකුත් රෙදිපිළි අවශ්‍යතා සැපයීම.

**කාර්යයන්**

- මෙම අංශය විසින් අමාත්‍යාංශය යටතේවූ පහත සඳහන් ආයතනයන්හි ආයතනික හා පරිපාලන කටයුතු සඳහා දායක වීම
  - වෙරළ සංරක්ෂණ හා ජලජ සම්පත් කළමානකරණ දෙපාර්තමේන්තුව
  - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා
  - පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
  - ලංකා ලොජිස්ටික් ඇන්ඩ් ටෙක්නොලොජීස් පුද්ගලික සමාගම

- **සන්නිවේදන සහ ඉංජිනේරු කටයුතු**
  - පහත දක්වා ඇති රේඛීය අමාත්‍යාංශ සහ ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් සහ සහයෝගීත්වයෙන්, ජාතික ආරක්ෂාව සඳහා වැදගත් වන සන්නිවේදන සහ ඉංජිනේරු කාර්යයන් සම්බන්ධව වැඩ කටයුතු කරන ලදී. ජනාධිපති කාර්යය සාධක බලකායේ ලේකම් කාර්යාලය
  - ජනමාධ්‍ය සහ තොරතුරු අමාත්‍යාංශය
  - ආපදා කළමනාකරණ සහ මානව හිමිකම් පිළිබඳ අමාත්‍යාංශය
  - තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය
  - ශ්‍රී ලංකා යුධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ පොලීසිය
  - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම
  - කාලගුණ දෙපාර්තමේන්තුව
  - පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
  - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
  - රේගු දෙපාර්තමේන්තුව
  - මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
  - සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
  - මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය
  - ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය
  - සිවිල් අංශයේ විදුලි සංදේශ ක්‍රියාකරුවන්
  - විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය
  - ලංකා විදුලි බල මණ්ඩලය

- සන්නිවේදන උපකරණ ආනයනය, නැවත සවි කිරීමට සහ ප්‍රවාහනය කිරීමට සඳහා අනුමැතිය ලබා දීම.

| අංකය | උපකරණ | රජය | පුද්ගලික |
|---|---|---|---|
| 1 | VHF ගුවන් විදුලි සේවාවන් | - | 23 |
| 2 | GPS | 03 | 54 |
| 3 | චන්ද්‍රිකා රිසීවරයන් | - | 02 |
| 4 | FMසම්ප්‍රේෂක | - | 20 |
| 5 | වාහන හැසිරවීමේ පද්ධතිය | - | 11 |

- ඉලෙක්ට්‍රොනික /සන්නිවේදන උපකරණ වෙළෙඳාම් කිරීමේ ව්‍යාපාරික කටයුතු සඳහා නිශ්කාශන වලින් පසුව බලපත්‍ර ලබා දීම -125
- ගුවන් විදුලි සංඛ්‍යාත වෙන් කරවා ගැනීම සඳහා අනුමැතිය ලබාදීම.
- ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතීන් (GPS) ආනයනය සඳහා අනුමැතිය ලබාදීම.
- රථ වාහන හැසිරවීමේ පද්ධතීන් ආනයනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම
- ගුවන් විදුලි සම්ප්‍රේෂණ උපකරණ සහ රූපවාහිනී උපාංග ආනයනයටත් සම්ප්‍රේෂන කුළුණු ඉදිකිරීමටත් අනුමැතිය ලබාදීම.

| අංකය | නම | කුළුණු ගණන |
|---|---|---|
| 01 | ඩයලොග් ටෙලිකොම් පීඑල්සී | 207 |
| 02 | හචින්සන් සන්නිවේදන සමාගම | 131 |
| 03 | මොබිටෙල් පුද්ගලික සමාගම | 245 |
| 04 | එටිසලාට් ලංකා පුද්ගලික සමාගම | 219 |
| 05 | ලංකාබෙල් පුද්ගලික සමාගම | 01 |
| 06 | එයාර්ටෙල් පුද්ගලික සමාගම | 38 |
| 07 | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | 01 |
| | එකතුව | **842** |

- විකුණුම්කරුවන්ගේ බලපත්‍ර අනුමත කිරීම.
- අධිආරක්ෂිත කලාපයන්හි උපායමාර්ගික සන්නිවේදන ජාලසංරචක ප්‍රකාශයට පත් කිරීම.

  – ගෝනගල – කොකාවිල් – පිදුරුතලාගල – කරගස්තැන්න
  – කිකිලියමාන – මඩුකන්ද – හන්තාන

- **යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති**

- උපායමාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාලයක් නිර්මාණය කිරීම සඳහා මූලික පියවර ගෙන ඇත.එමඟින් රට තුළ ආරක්ෂක සන්නිවේදනයෙහි ධාරිතාව සහ විශ්වසනීයත්වය වැඩි දියුණු කළ හැක.
- Dialog Axiata PLC සහ Mobitel (PVT) Ltd යන සමාගම් සමඟ සම්බන්ධීකරණය වෙමින් උතුරු පළාතේ අළුතින් මුදවාගත් ප්‍රදේශවල සන්නිවේදන පහසුකම් ස්ථාපනය කරන ලදී. මෙම ව්‍යාපෘතිය මඟින් "අපි වෙනුවෙන් අපි සුභසාධක අරමුදල" සඳහා සැලකිය යුතු ආදායමක් එක්රැස් කර ගැනීමට හැකිවිය.
- ආරක්ෂක මූලස්ථාන ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කිරීම.
- ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය සඳහා පෙර සවි නිවාස සැදීමේ ව්‍යාපෘතිය සම්බන්ධීකරණය සහ කළමනාකරණය කිරීම. පසුගිය වසරේදී මෙම ව්‍යාපෘතිය ඉතා සාර්ථක ලෙස ක්‍රියාවට නැංවූ අතර එම ව්‍යාපෘතියේ 95% නිම කිරීමට හැකි විය.

- **කොළඹ අගනගරය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය කොටස් තුනකින් සමන්විතය. මෙහි පළමු කොටස ජල ගැලීම් සහ ජලාපවාහන කළමනාකරණය සම්බන්ධයෙන් වන අතර එමඟින් නාගරික ජල ගැලීම් පාලනය කිරීමට අපේක්ෂිතය. මෙහි දෙවන කොටස නාගරික සංවර්ධන සහ යටිතල පහසුකම් පුනරුත්ථාපනය අරමුණු කර ගනිමින් කොළඹ මහ නගර සභාව, දෙහිවල ගල්කිස්ස මහනගර සභාව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව සහ කොලොන්නාව නගර සභාව යනාදී ප්‍රාදේශීය අධිකාරීන් තුළ ක්‍රියාත්මක වේ. මෙමඟින් ජලාපවාහන යටිතල පහසුකම් සහ නාගරික මාර්ග පුනරුත්ථාපනය, නගර දියුණු කිරීම සඳහා ආයෝජන ක්‍රියාත්මක කිරීම සහ ඝණ අපද්‍රව්‍ය එකතු කිරීම වැඩිදියුණු කිරීම යනා දී දෑ ඉටු කර ගැනීමට අපේක්ෂිතය.මෙහි තුන්වන කොටසින් ක්‍රියාකාරි සහය ලබා දේ. මෙම ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කාල සීමාව 2012.04. 30 - 2017 .06.30 දක්වා ය.

# 6.7 නාගරික සංවර්ධන අංශය

වඩා සැලසුම්ගත නගර සහතික කිරීම උදෙසාත්, ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමටත්, නාගරික සංවර්ධනය සඳහා අවශ්‍ය තිරසාර ඉඩම් භාවිතය සහතික කිරීම සඳහාත් ඓතිහාසික වැදගත්කමක් ඇති ගොඩනැගිලි සංරක්ෂණය කර සංවර්ධන කාර්යයන් සඳහා යොදා ගැනීම සඳහාත්, නාගරික සංවර්ධන අධිකාරියේ කළමණාකාරීත්වයට අවශ්‍ය මගපෙන්වීම හා අධීක්ෂණය මෙම අංශය මගින් සිදුවේ.

නාගරික සංවර්ධනයේ පෙර ගමන් කරුවූ නාගරික සංවර්ධන අධිකාරියේ නාගරික සංවර්ධන කාර්යයන්ට අමතරව හඳුනාගත් ප්‍රධාන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අධීක්ෂණය නාගරික සංවර්ධන අංශය තුලින් ලබා දෙමින් සිටි.

| ව්‍යාපෘතිය | ප්‍රගතිය |
|---|---|
| නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය - කොළඹ නගරය  | කොළඹ නගරය සංවර්ධනය කිරීමට අවශ්‍ය ප්‍රධාන අංගයක් ලෙස හඳුනාගත් අඩුපහසුකම් ජනාවාසයන්හි අඩුපහසුකම් නිවාස වෙනුවට වඩාත් පහසුකම් සහිත මහල් නිවාස ඒකක 70,000 ඉදිකිරීෙම් භාරදූර කාර්යයෙන්,  වසර 2015 වන විට නිවාස 20,000ක් ඉදිකිරිමේ ඉලක්කය සපුරා ගැනීම සහ පලමු අදියරේදී කොළඹ නගරයේ ස්ථාන 11ක නිවාස 9801 ක් ඉදිකරමින් පවතින අතර මේ වන විටත් දෙවන අදියර ලෙස ස්ථාන 06 ක නිවාස 3463 ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. |
| බත්තරමුල්ල පුද්ගල අනන්‍යතා මහ ලේකම් කාර්යාලය  | මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2012 ජුලි මස ආරම්භ වූ අතර කොන්ත්‍රාත් කාලය මාස 36 කි.  2013 ජුලි මස 31 වන දිනට ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු වල භෞතික ප්‍රගතිය 22.54% වන අතර මූල්‍ය ප්‍රගතිය 28.7% ක් වේ. |
| පිටත වටරවුම් ආශ්‍රිත නගර සංවර්ධන ව්‍යාපෘතිය (3K ව්‍යාපෘතිය)  | **අදියර 1** - කොට්ටාව, කඩුවෙල, කඩවත නගර සංවර්ධන යෝජනා  සකස් කර නාගරික සංවර්ධන අධිකාරිය හා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇත.<br>**අදියර 11**<br>කඩුවෙල වැලිවිට මාර්ගය හා සුහද මාවත සංවර්ධන කිරීම සඳහා ටෙන්ඩර්පත් කැඳවීම අවසන් ඇති අතර ඉදිකිරීම් සැප්තැම්බර් මස ආරම්භ කිරීම.<br>කොට්ටාව - මාලබේ මාර්ගය - ඉඩම් අත්පත් කරගෙන ඇත.<br>කොට්ටාව - පන්නිපිටිය මාර්ගය - ඉඩම් අත්පත් කරෙගන ඇත.<br>3) මාකුඹුර බහුවිධ ප්‍රවාහන පද්ධතිය, බස්නැවතුම්පල සහ දුම්රිය ස්ථාන ඒකාබද්ධව සංවර්ධනය කිරීම - සැලසුම් සකස් කර ඇත, පරිසර වාර්තාව පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇත. ඉඩම් අත්පත් කර ඇත. |
| හම්බන්තොට නගර සංවර්ධන ව්‍යාපෘතිය (ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා ව්‍යාපෘතිය)  | **ඉදිකිරීම් අදියර** - ප්‍රධාන සම්මන්ත්‍රණ ශාලාව 88%<br>**ඉදිකිරීම් අදියර 11** - අනෙකුත් කමිටු ශාලා, ප්‍රවේශ ශාලා,  උපයෝගී ශාලා, ආපන ශාලා 87%<br>**ඉදිකිරීම් අදියර 111** - බාහිර ඉදිකිරීම්, අභ්‍යන්තර මාර්ග හා භූමි අලංකරණය 70% |

## 6.8 ගිණුම් අංශය

### ප්‍රසම්පාදන අංශය

මෙම අමාත්‍යාංශය යටතේ පවත්නා සියළුම දෙපාර්තමේන්තු හා ව්‍යාපෘතීන්ට අදාලව ප්‍රසම්පාදන කමිටු පත් කිරීම, ඒවායේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම, සමාලෝචනය හා අවශ්‍ය වෙනස් කම් සිදු කිරීම.රාජ්‍ය ප්‍රසම්පාදනවලට අදාල ප්‍රතිපත්තිමය රෙගුලාසිමය හා මාර්ගෝපදේශණමය කරුණු සම්බන්ධව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවත් සමග නිරන්තර සංවාදයක යෙදීම හා කාර්යක්ෂම ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සඳහා අවශ්‍ය සැලසුම් සිදු කිරීම.

- මානුෂීය මෙහෙයුම් තුළින් මුදවා ගන්නා ලද ප්‍රදේශවල සිවිල් පරිපාලනය ස්ථාපිත කිරීමට හා නීතිය හා සාමය ආරක්ෂා කිරීමට ඉවහල් වන අත්‍යාවශ්‍ය ප්‍රසම්පාදනයන් අප්‍රමාදීව ඉටු කිරීමට (උදා - ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය රථවාහන, ගොඩනැගලි, නිල ඇඳුම්, සන්නිවේදන උපකරන ආදිය)

- රුසියානු ණය යෝජනා ක්‍රම යටතේ යුධ හමුදාවට හා ගුවන් හමුදාවට අවශ්‍ය වන භාණ්ඩ වඩා ඵලදායී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුළින් මිල දී ගැනීම සඳහා කටයුතු කිරීම.

- ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ඩොලර් 145.9ක වටිනාකමකින් යුත් නවීන වර්ගයේ සාගර මුර සංචාර යාත්‍රා 2ක් මිල දී ගැනීම අවශ්‍ය සඳහා ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම.

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම.

- කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ඉදි කිරීමට යෝජනා කර ඇති පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම.

- ත්‍රිවිධ හමුදා මූලස්ථානය ඉදිකිරීමට අදාලව අකුරේගොඩ ව්‍යාපෘතියේ මිල දී ගැනීම් (යකඩ, සිමෙන්ති, කොන්ක්‍රීට්) සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම.

- නාරාහේන්පිට යුධ හමුදා රෝහල සඳහා අලුතින් ඉදි කරන ලද දස මහල් ගොඩනැගිල්ල සඳහා රුපියල් මිලියන 1000ක වටිනාකමකින් යුතු වෛද්‍ය උපකරණ ලබා ගැනීමට අදාලව ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම.

### වැටුප් අංශය

- අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන්ගේ, රාජ්‍ය බුද්ධි සේවාව, පොලිස් විශේෂ කාර්යංශය, ජාතික ශිෂ්‍ය භට බලකාය, ජාතික මාධ්‍ය මධ්‍යස්ථානය ඇතුළු අමාත්‍යාංශයට අනුයුක්ත සියලුම ව්‍යාපෘති වල වැටුප් සැකසීම, හිඟ වැටුප් සැකසීම, අතිකාල දීමනා ගෙවීම, ගමන් වියදම් (දේශීය/විදේශීය) ගෙවීම් සහ විශ්‍රාම වැටුප් සැකසීම.
- අමත්‍යාංශය ඇතුළු සියලුම ව්‍යාපෘති වල සියලුම නිලධාරීන්ගේ වැටුප් අතිකාල සහ ගමන් වියදම් 2012 ජුනි මාසයේ සිට බැංකු ගත කිරීමේ කටයුතු ආරම්භ කිරීම.

### ණය අත්තිකාරම් අංශය.

රාජ්‍ය සේවකයන්ගේ ශුභ සිද්ධිය තකා රජය මගින් සහනදායි පොලී ක්‍රමයක් යටතේ මෙම අමාත්‍යාංශයේ මෙන්ම රාජ්‍ය බුද්ධි සේවයේ, විශේෂ කාර්ය බලකායේ, ජාතික ශිෂ්‍ය භට බලකායේ සහ භාෂා පුහුණු මධ්‍යස්ථානවල සේවයේ නියුතු නිලධාරීන් සඳහා ණය පහසුකම් ලබාදීම සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.

ඉහත අරමුණු සාක්ෂාත් කරගැනිම සඳහා මෙම අංශය විසින් 2013 වසර තුලදී ඉහත නිලධාරීන් සඳහා රජයේ ප්‍රතිපාදන යටතේ ලබාදුන් ණය පිළිබඳ සාරාංශගත තොරතුරු පහත පරිදි වේ.

| | |
|---|---|
| අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා | 40,348,790 .63 |
| නාගරික සංවර්ධන අංශයේ නිලධාරීන් සඳහා | 2,892,041 .00 |
| විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් සඳහා | 56, 043,864.00 |
| | **99,284,696.00** |

| | වියදමෙහි උපරිම සීමාව | ලැබීම්වල අවම සීමාව | හර ශේෂයේ උපරිම සීමාව |
|---|---|---|---|
| විසර්ජන පනතින් බලය දෙනු ලැබූ සීමාවන් | 285,000,000.00 | 120,000,000.00 | 650,000,000.00 |
| වර්ෂය තුළ ප්‍රතිශෝධිත සීමාව | 200,000,000.00 | 110,000,000.00 | 500,000,000.00 |
| වර්ෂය අවසානයේ නිත්‍ය අගයන් | 99,284,696.00 | 140,270,439.00 | 332,606,220.00 |

**ඒ අනුව 2013 වර්ෂයේ අදාල සීමාවන් තුළ රැදෙමින් කටයුතු කර ඇති අතර මු.රේ 506 (ඩී) ප්‍රකාර රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් වාර්ෂික සැසදුම් ප්‍රකාශය විගණකාධිපති වෙත ඉදිරිපත් කෑ ඇත.**

## මුදල් අංශය

- වාර්ෂික අක් මුදල් අවශ්‍යතාවය භාණ්ඩාගාරයට ඉදිරිපත් කර අනුමත කරවාගෙන මාසිකව භාණ්ඩාගාරයෙන් අක් මුදල් ලබා ගැනීම හා ගිණුම් ඒකක වෙත අක්මුදල් නිදහස් කිරීම.
- මාසිකව ඒකාබද්ධ ගිණුම් සාරාංශය පිළියෙල කර භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම හා අමාත්‍යංශ ගිණුම්, භාණ්ඩාගාර ගිණුම් සමඟ සැසඳීම.
- විසර්ජන ගිණුම පිළියෙල කිරීම.
- පුපුරන ද්‍රව්‍ය හා ගිණි අවි බලපත්‍ර (1003/07/05/ශීර්ෂය) ආදායම් ගිණුම පිළියෙල කිරීම.
- අමාත්‍යංශය යටතේ ඇති දෙපාර්තමේන්තු වල නිල බැංකු ගිණුම් විවෘත කිරීම, වැසීම හා අවශ්‍ය සංශෝධනයන් සිදු කිරීම යනාදියට අදාලව බැංකු හා භාණ්ඩාගාරය සමඟ සන්නිවේදන කටයුතු කිරීම.
- මූලධන මිලදී ගැනීම් සඳහා ගෙවීම් කිරීම.
- විදේශ තානාපති/මහ කොමසාරිස් කාර්යාල වලට අනුයුක්ත රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශයේ නියෝජිතයින් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම හා වියදම් වාර්තා ලබා ගැනීම.
- වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා පරිපූරක ඇස්තමේන්තුව පිළියෙල කිරීම.
- අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු, ආයතන වලට අවශ්‍ය අමතර ප්‍රතිපාදන ලබාගැනීම, ප්‍රතිපාදන නිදහස් කිරීම හා ප්‍රතිපාදන මාරු කිරීම.

භාණ්ඩාගාරයෙන් අක් මුදල් ලබා ගැනීම

| | 2012 වර්ෂය රු. | | 2013 වර්ෂය ජුලි 31 දිනට රු. | |
|---|---|---|---|---|
| | අනුමත වාර්ෂික අක් මුදල් සීමාව | අක් මුදල් ලැබීම | අනුමත වාර්ෂික අක් මුදල් සීමාව | අක් මුදල් ලැබීම |
| පුනරාවර්තන | 5,857,790,000 | 5,196,000,000 | 8,937,777,000 | 4,060,100,000 |
| ප්‍රාග්ධන | 2,329,339,000 | 1,878,080,000 | 6,754,492,000 | 1,855,000,000 |
| ර නි අ බි ගිණුම | 250,000,000 | 77,465,000 | 285,000,000 | 74,430,000 |

පුපුරණ ද්‍රව්‍ය හා ගිණි අවි බලපත්‍ර ආදායම් එකතු කිරීම

| වර්ෂය | ඇස්තමේන්තුව රු. (මිලියන) | සත්‍ය ආදායම රු. (මිලියන) |
|---|---|---|
| 2011 | 12.00 | 10.088 |
| 2012 | 12.25 | 10.08 |
| 2013(2013-07-31 දක්වා) | 12.25 | 5.2 |

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශය 2013 වර්ෂය සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන

| වියදම | 2013 වර්ෂය සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන |
|---|---|
| ප්‍රාග්ධන වියදම් | 15277,492 |
| පුනරාවර්තන වියදම් | 13597,715 |
| එකතුව | 28875,207 |

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ඒ ඒ ව්‍යාපෘති වැඩසටහන් අනුව 2013 වර්ෂය සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන

| ව්‍යාපෘතින්/වැඩසටහන් | 2013 වර්ෂය සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන | |
|---|---|---|
| මෙහෙයුම් වැඩසටහන් | ප්‍රාග්ධන වියදම් | පුනරාවර්තන වියදම් |
| 1. ඇමතිතුමාගේ කාර්යාලය | 1,350 | 11,460 |
| 2. අමාත්‍යාංශ පරිපාලනය සහ ආයතන සේවා | 288,447 | 6963,890 |
| 3. රාජ්‍ය බුද්ධි සේවාව | 19,600 | 671,815 |
| 4. ජාතික ශිෂ්‍ය භට බලකාය | 14,150 | 367,030 |
| 5. පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය | 3,210 | 8,500 |
| 6. ජාතික ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානය | 580 | 15,090 |
| 7. ඒකාබද්ධ මෙහෙයුම් මධ්‍යස්ථානය | 1,205 | 44,080 |
| 8. විශේෂ කාර්ය බලකාය | 337,950 | 4823,350 |
| 9. යටිතල පහසුකම් සංවර්ධන | 12611,000 | 692,500 |
| එකතුව | 15277,492 | 13597,715 |

## සැපයීම් හා අලාභහානි අංශය.

- 2013 වර්ෂය වෙනුවෙන් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමෙන් රුපියල් මිලියන 23 ක පමණ ආදායමක් උපයාගෙන රජයේ අරමුදලට බැර කිරීම.
- රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ හා ඒ යටතේ පාලනය වන ආයතන වලට තම කාර්යභාරය ඉටුකර ගැනීම උදෙසා අවශ්‍ය භාණ්ඩ හා සේවා නිසි ප්‍රමිතියට අනුකූලව අවම පිරිවැයක් දරමින් නිසි කාලපරිච්ඡේදය තුළදී විනිවිධභාවයකින් යුතුව ලබාදීම.
- පරිගණක පද්ධතියක ආධාරයෙන් ප්‍රාග්ධන භාණ්ඩ නිකුත් කිරීමට අවශ්‍ය මූලික සැලසුම් සකස් කිරීම.
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා අපහරණ කටයුතු නිසි පරිදි ඉටුකිරීම තුලින් නාස්තිය, දූෂණය හා අක්‍රමිකතා අවම කර ගනිමින් රජයේ දේපළ ආරක්ෂා කර ගැනීම.
- අමාත්‍යාංශයේ හා ඒ යටතේ පාලනය වන විවිධ දෙපාර්තමේන්තුවල ස්ථාවර වත්කම් සංචලන විචලනයන් පිළිබඳ සොයා බලා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්ථා කිරීම.
- මු.රෙ. 115 යටතේ අමාත්‍යාංශය හා ඊට අයත් දෙපාර්තමේන්තු වල සියලුම පසුගිය වර්ෂ වල හිඟ ගෙවීම් වලට අදාල අනුමැතිය ලබා දීම.
- මු.රෙ. 835 යටතේ අමාත්‍යාංශය හා ඊට අයත් දෙපාර්තමේන්තු වල ගෙවල් කුළී ගෙවීමට අනුමැතිය ලබා දීම.
- මු.රෙ. 835 යටතේ අමාත්‍යාංශය හා ඊට අයත් දෙපාර්තමේන්තු වල පුවත්පත් මිලදී ගැනීමට අනුමැතිය ලබා දීම.
- අළුත්වැඩියා සඳහා ටෙන්ඩර් මාර්ගෝපදේශ 9:3 (1) යටතේ අනුමැතිය ලබාදීම.
- ස්ථාවර වත්කම් කළමනාකරණ පද්ධතියක් මඟින් අමාත්‍යාංශය සතු ස්ථාවර වත්කම් කළමනාකරණය.

**2014 වර්ෂයේ ලඟාකර ගැනීමට අපේක්ෂිත ඉලක්කයන්.**

| | ඉටුකිරීමට අපේක්ෂිත කාර්යයන් | අරමුණ | පරමාර්ථය |
|---|---|---|---|
| 01 | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම. අසාධු ලේඛණගත කිරීම | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති සියලුම ආයතන වල ප්‍රසම්පාදන කටයුතු වලට අවශ්‍ය පසුබිම සැකසීම. | රු: මිලියන 25 කට වැඩි ආදායමක් අපේක්ෂා කරයි. |
| 02 | ප්‍රසම්පාදන කටයුතු | කාර්යාල පරිශ්‍රය තුල හා ඉන් පිටත ආයතනයන් හි රාජකාරී කටයුතු නොපිරිහෙලා ඉටු කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සැලසීම. | කාර්යක්ෂම ප්‍රසම්පාදනයක් ලබාදීම. |
| 03 | භාණ්ඩ සැපයීම, ගබඩා කිරීම සහ බෙදාදීම. | කාර්යක්ෂම හා ඵලදායී අයුරින් භාණ්ඩ මිලදී ගැනීම හා බෙදාදීම. | නාස්තිය හා දූෂණය අවම කර ගැනීම හා නිසි පරිදි වාර්තාකරණය. |
| 04 | භාණ්ඩ සමීක්ෂණය, අයෝග්‍ය කිරීම, තක්සේරු කිරීම, වෙන්දේසි කිරීම,ප්‍රාග්ධන භාණ්ඩ පිළිබඳව අවශ්‍ය දත්ත මහා භාණ්ඩාගාරය වෙත ලබා දීම. | රජයට අයත් භෞතික භාණ්ඩ ආරක්ෂා කිරීම පාවිච්චියෙන් ඉවත්කරන භාණ්ඩ අවශ්‍ය ආයතනවලට ලබාදීම හා වෙන්දේසි කිරීම.පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ විනාශ කිරීම. | රාජ්‍ය දේපල ආරක්ෂා කිරීම හා අයථා භාවිතය වැලැක්වීම. හඳුනාගැනීම ලේඛණගත කිරීම. |
| 05 | නැතිවීම් හා අලාභහානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීම. | රජයේ දේපලවලට සිදුවන අලාභහානි සම්බන්ධව වගකිව යුතු පාර්ශවයන් සොයා බලා ඒ අනුව අලාභයන් අයකර ගැනීම හා එසේ නොවන අවස්ථාවල මු.රෙ ප්‍රකාරව අවශ්‍ය පියවර ගැනීම. | රජයේ දේපල වලට සිදුවන අලාභහානි අවම කිරීම. |
| 06 | ස්ථාවර වත්කම් කළමණාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම තුලින් ජංගම නොවන වත්කම් කළමණාකරණය කිරීම. | අමාත්‍යාංශය විසින් ලබාගන්නා ලද ජංගම නොවන වත්කම් අවශ්‍ය අවස්ථාවන්හි අවශ්‍ය ස්ථාන වලට ලබාදීම. ඒවායේ චලනයන් නිවැරදිව හඳුනාගැනීම හා නිසි භාරකාරත්වය තහවුරු කර ගැනීම. | රජයේ දේපල සුරැකීම. |

## “අපි වෙනුවෙන් අපි” නිවාස අරමුදල

- “අපි වෙනුවෙන් අපි” අරමුදල ගොඩනැගීම හා වර්ධනය කර ගැනීමට රජයේ ආයතන වන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සේවකයන් හා පෞද්ගලික ආයතන වන බැංකු සමාගම්, විදේශ රටවල වෙසෙන ශ්‍රී ලාංකිකයන් හා මහජනතාව දැනුවත් කර මුදල් රැස්කිරීම හා ඒවා නිසි ලෙස ගිණුම් ගත කිරීම සිදුකර ඇත.
- මෙම අරමුදල සතු මුදල් සුදුසු ආයෝජන මාර්ග වල යෙදවීමට කළමණාකරන මණ්ඩලය දුන් අනුමැතියට අනුව “අපි වෙනුවෙන් අපි”අරමුදල වර්ධනය කර ගැනීම සඳහා අරමුදල සතු මුදල් රජයේ භාණ්ඩාගාර බිල්පත් වල සහ ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර ඇත.
- “අපි වෙනුවෙන් අපි” අරමුදලේ ප්‍රධාන පරමාර්ථයක් වන සන්නද්ධ හමුදා සාමාජිකයන්ට නිවාස පහසුකම් සලසා දීම හා ඒ සඳහා ආධාර ලබාදීම යටතේ රට දැය වෙනුවෙන් උදාරතර මෙහෙවරක් ඉටු කල ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී දිවි පිදූ රණවිරුවන්ගේ ලඟම ඥාතීන් නමින් හා ක්‍රියාන්විතයේදී ආබාධිතවූවන් හා සේවයේ නියුතු රණවිරුවන් වෙනුවෙන් දීප ව්‍යාප්තව ඉදි කෙරෙන නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.

- මෙම රණවිරු නිවාස යෝජනා ක්‍රමය ක්‍රියාවට නැංවීමේ ප්‍රතිඵලයක් ලෙස රත්නපුර, මාතලේ හා නුවරඑළිය යන දිස්ත්‍රික්කයන්හි නිවාස ඉදිකර රණවිරුවන්හට භාරදීමට කටයුතු කර ඇත. කොළඹ, කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි රණවිරු නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවතින අතරඅනුරාධපුර දිස්ත්‍රික් නිවාස ව්‍යාපෘතිය ඉදිරියේදි ආරම්භ කිරීමට නියමිතය .

| දිස්ත්‍රික්කය | නිවාස ප්‍රමාණය | වැයකල මුදල (රුපියල්) |
|---|---|---|
| රත්නපුරය | 95 | 111,652,025.68 |
| මාතලේ | 100 | 109,137,355.00 |
| නුවරඑළිය | 102 | 122,000,000.00 |
| කොළඹ | 112 | 90,000,000.00 |
| කුරුණෑගල | 100 | 30,000,000.00 |
| අනුරාධපුරය | 115 | - |
| **එකතුව** | **624** | **462,789,380.68** |

- මෙම අරමුදලින් රණවිරුවන් සඳහා නිවාස ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේදී එම කටයුතු විධිමත් ලෙස ඉටු කර ගැනීමට අදාල උපදෙස්, මගපෙන්වීම් හා තොරතුරු මෙම අංශය වෙතින් නිරන්තරයෙන් ලබා දීමට කටයුතු කර ඇත.

**ඉදිරි වසරේ ඉලක්ක**

- අරමුදල වර්ධනය කර ගැනීම සඳහා ප්‍රචාරණ කටයුතු තුලින් බාහිර පාර්ශවයන් දැනුවත් කිරීම සහ නව වැඩසටහන් ක්‍රියාවට නැංවීමට කටයුතු කිරීම .
- රණවිරුවන් සඳහා දීපව්‍යාප්තව ඉදිවන "අපි වෙනුවෙන් අපි" නිවාස ව්‍යාපෘතිය යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ නිවාස 100 ක්ද, මහනුවර දිස්ත්‍රික්කයේ (2 වන අදියර) නිවාස 100 ක්ද, මාතර දිස්ත්‍රික්කයේ (2 වන අදියර) නිවාස 100 ක්ද, හම්බන්තොට දිස්ත්‍රික්කයේ (2 වන අදියර) නිවාස 100 ක්ද, බදුල්ල දිස්ත්‍රික්කයේ (2 වන අදියර) නිවාස 100 ක්ද, මොණරාගල දිස්ත්‍රික්කයේ (2 වන අදියර) නිවාස 100 ක්ද, ගාල්ල දිස්ත්‍රික්කයේ (2 වන අදියර) නිවාස 100 ක්ද වශයෙන් නිවාස ව්‍යාපෘති 07 ක් ක්‍රියාවට නැංවීම.

## අභ්‍යන්තර විගණන අංශය

2013 වර්ෂයේ සිදු කරන ලද අභ්‍යන්තර විගණන පරීක්ෂණ

| | |
|---|---|
| රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කිරීම.<br>රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් 'බී' ගිණුම පරීක්ෂාව.<br>ප්‍රසම්පාදන පරීක්ෂාව.<br>වැය ලෙජර් පරීක්ෂාව.<br>විසර්ජන ගිණුම පරීක්ෂාව.<br>කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය<br>ආරක්ෂක අමාත්‍යාංශ මූලස්ථානය හා ත්‍රිවිධ හමුදා මූලස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය |
| රණවිරු සේවා අධිකාරිය | ඉඩම් බෙදා දීම හා රණවිරු මාපිය දීමනාව පරීක්ෂාව.<br>ගෙවීම් වවුචර්පත් පරීක්ෂාව.<br>සංසද නිවාස ණය සහ ණය අත්තිකාරම් පරීක්ෂාව<br>වාහන හදිසි අනතුරු පරීක්ෂාව |

| | |
|---|---|
| අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය | ගිණුම් අංශය - වවුචර් පරීක්ෂාව.<br>ප්‍රසම්පාදන අංශය.<br>CCTV කැමරා පද්ධති හා බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර භාවිතා කිරීම.<br>ප්‍රවාහන අංශය.<br>වාහන නඩත්තුව හා අළුත්වැඩියා කටයුතු සිදු කිරීම.<br>ලොග්පොත් හා වාහන සම්බන්ධ ලේඛණ පරීක්ෂාව.<br>පරිපාලන අංශය<br>පෞද්ගලික ලිපිගොනු, විදුලි බිල්පත්, ස්ථාවර වත්කම් ලේඛණය සහ පරිගණක වත්කම් ලේඛණය පරීක්ෂාව<br>වැටුප් අංශය<br>රියදුරන්ගේ අතිකාල දීමනා<br>ප්‍රතිකාර මධ්‍යස්ථාන<br>නව දිගන්තය හා උණවටුණ ප්‍රතිකාර මධ්‍යස්ථාන පරීක්ෂාව |
| රාජ්‍ය බුද්ධි සේවය | ප්‍රවාහන අංශය හා<br>භාණ්ඩ සමීක්ෂණ කටයුතු පරීක්ෂාව |
| ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය | ගිණුම් පරීක්ෂා කිරීම |
| විශේෂ කාර්ය බලකාය | ප්‍රසම්පාදන ලිපිගොනු පරීක්ෂාව.<br>ගිණුම් අංශයේ වවුචර්, සංයුක්ත දීමනා හා දුෂ්කර දීමනා, විදුලි බිල්පත් හා ජල බිල්පත් පරීක්ෂාව.<br>ණය අත්තිකාරම් පරීක්ෂාව.<br>ගෝනහේන කඳවුර - ගබඩා පරීක්ෂාව |

- විගණකාධිපති විගණන විමසුම් වලට පිළිතුරු ලබා දීම.
  - අමාත්‍යාංශය වෙත ලැබූ විගණන විමසුම් ගණන - 19
    පිළිතුරු ලබා දුන් සංඛ්‍යාව - 16
  - අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා සංස්ථාපිත ආයතන වලට ලද විගණකාධිපති විගණන විමසුම් 155 ක් සඳහා පිළිතුරු ලබා දීම සහ සම්බන්ධීකරණය.
  - විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.

    කාර්තුවකට එක බැගින් රැස්වීම් පැවැත්වීමට නියමිත අතර, මෙම වර්ෂයේ කාර්තු දෙකක් සඳහා රැස්වීම් තුනක් පවත්වා ඇත.

- ත්‍රිවිධ හමුදාවන්හි පොදු භාණ්ඩ, වාහන, අවි හා පතරොම් සඳහා අපහරණ මණ්ඩල පත් කිරීම.

පාවිච්චියට නුසුදුසු පතුරොම්/ වෛද්‍යව්‍ය පරීක්ෂා කිරීමට පත් කර ඇති මණ්ඩල ගණන - 04

පාවිච්චියට නුසුදුසු අවි පරීක්ෂා කිරීමට පත් කර ඇති මණ්ඩල - 01

වාහන/ පොදු භාණ්ඩ පරීක්ෂා කිරීමට පත් කර ඇති මණ්ඩල - 06

- රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත පිළිතුරු ලබා දීම.
  - ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය
  - ලංකා ලොජිස්ටික් ලිමිටඩ්
  - රක්නා ආරක්ෂක ලංකා ලිමිටඩ්
  - අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
  - ආගමන හා විගමන දෙපාර්ත්මේන්තුව
  - පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
  - ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය
  - ආරක්ෂක සේවා විද්‍යාලය

## 7.1 අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය

**<u>රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය 2013- 12- 31 දිනට මූල්‍ය වාර්තාව</u>**

රු.'000

| වියදම | ** 2013වර්ෂයේලබාදීඇතිප්‍රතිපාදන | 2013-12-31 දිනට වියදම | ප්‍රතිශතය |
|---|---|---|---|
| ප්‍රාග්ධන වියදම් | **18,725.49** | **12,507.30** | **66.7%** |
| පුනරාවර්ථන වියදම් | **10,866.77** | **9,170.19** | **84.4%** |
| එකතුව | **29,592.26** | **21,677.49** | **73.2%** |

රු.'000

| ව්‍යාපෘති අංකය | ව්‍යාපෘතිය/වැඩසටහන | **2013 වර්ෂයේදී ලබා දී ඇති ප්‍රතිපාදන හා 2013-12-31 දිනට මුළු වියදම** | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්ථන වියදම් | | | | | | ප්‍රාග්ධන වියදම් | | | | | | | | | |
| | | පුද්ගල පඩිනඩි | | වෙනත් | | එකතුව | | මූලධන වත්කම් පුනරුත්ථාපනය, වැඩිදියුණු කිරීම් | | වත්කම් අත්පත් කර ගැනීම් | | මානව සම්පත් සංවර්ධනය | | වෙනත් | | එකතුව | |
| | මෙහෙයුම් වැඩසටහන් | ප්‍රතිපාදන** | වියදම | ප්‍රතිපාදන** | වියදම | ප්‍රතිපාදන** | වියදම | ප්‍රතිපාදන** | වියදම | ප්‍රතිපාදන** | වියදම | ප්‍රතිපාදන** | වියදම | ප්‍රතිපාදන** | වියදම | ප්‍රතිපාදන** | වියදම |
| 1 | අමාත්‍ය කාර්යාලය | 2.65 | 1.90 | 3.62 | 2.95 | 6.27 | 4.86 | 1.05 | - | 0.30 | - | | - | - | - | 1.35 | - |
| 2 | අමාත්‍යාංශ පරිපාලනය හා ආයතන සේවා | 245.72 | 228.25 | 3,404.13 | 2,144 | 3,649.85 | 2,372.25 | 29.40 | 24.26 | 48.90 | 27.74 | 1.80 | 1.16 | 5167.25 | 4,868.29 | 5,247.34 | 4,921.45 |
| 3 | රාජ්‍ය බුද්ධි සේවාව | 565.30 | 545.63 | 296.83 | 272.76 | 862.12 | 818.39 | 8.60 | 6.73 | 11.60 | 10.56 | 0.40 | 0.22 | - | - | 20.60 | 17.51 |
| 4 | ජාතික ශිෂ්‍ය භට බලකාය | 87.44 | 79.95 | 264.07 | 128.57 | 351.51 | 208.52 | 8.60 | 2.33 | 5.55 | 3.20 | - | - | - | - | 14.15 | 5.53 |
| 5 | පර්යේෂන හා සංවර්ධන මධ්‍යස්ථානය | - | - | 8.80 | 7.14 | 8.80 | 7.14 | 1.31 | 0.89 | 0.90 | 0.51 | 1 | 0.41 | 20 | 11.34 | 23.21 | 13.14 |
| 6 | ජාතික ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානය | 5.46 | 4.20 | 10.43 | 8.96 | 15.89 | 13.16 | 0.30 | 0.22 | 0.75 | 0.12 | 0.03 | 0.01 | - | - | 1.08 | 0.35 |
| 7 | ඒකාබද්ධ මෙහෙයුම් මධ්‍යස්ථානය | - | - | 254.57 | 142.25 | 254.57 | 142.25 | 0.61 | - | 15.40 | 14.75 | 20 | 0.25 | - | - | 36.01 | 15.00 |
| 8 | විශේෂ කාර්ය බලකාය | 3,319.77 | 3,319.29 | 1681.48 | 1,583.50 | 5,001.25 | 4,902.80 | 29.53 | 9.34 | 390.93 | 174.81 | 0.29 | 0.29 | - | - | 420.75 | 184.44 |
| 9 | යටිතල පහසුකම් සංවර්ධනය | - | - | 716.50 | 700.82 | 716.50 | 700.82 | 12.961 | 7,350.09 | - | - | - | - | - | - | 12961.00 | 7,350.09 |
| | | | | | එකතුව | **10,867** | **9,170.19** | | | | | | | | එකතුව | **18.725** | **12,507.51** |

# <u>ව්‍යාපෘති අනුව මූලධන වියදම්</u>

වියදම් ශීර්ෂ අංකය : 103 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් වැඩසටහන්

ව්‍යාපෘති අංකය හා නාමය : 01 අමාත්‍ය කාර්යාලය

| වැය ශීර්ෂය අංකය | අයිතම අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) මු.රෙ.66,69 අනුව මාරු කිරීම් පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (3-4) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | **<u>මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම</u>** | | | | | |
| 2001 | 0 | 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 500,000 | - | 500,000 | - | 500,000 |
| 2002 | 0 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 100,000 | - | 100,000 | - | 100,000 |
| 2003 | 0 | 11 | වාහන | 450,000 | - | 450,000 | - | 450,000 |
| | | | **<u>මූලධන වත්කම් අත්පත් කර ගැනීම</u>** | | | | | |
| 2102 | 0 | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 150,000 | - | 150,000 | - | 150,000 |
| 2103 | 0 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 150,000 | - | 150,000 | - | 150,000 |
| | | | එකතුව | **1,350,000** | **-** | **1,350,000** | **-** | **1,350,000** |

# <u>ව්‍යාපෘති අනුව මූලධන වියදම්</u>

වියදම් ශීර්ෂ අංකය : 103 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් වැඩසටහන්

ව්‍යාපෘති අංකය හා නාමය : 02 පරිපාලන සහ ආයතන සේවා

| වැය ශීර්ෂ අංකය | අයිතම අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | අයිතම විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) මු.රෙ.66,69 අනුව මාරු කිරීම් පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (3-4) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | <u>මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම</u> | | | | | |
| 2001 | 0 | 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 3,100,000 | 13,500,000 | 16,600,000 | 14,245,387 | 2,354,613 |
| 2002 | 0 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 2.800,000 | - | 2,800,000 | 1,102,145 | 1,697,855 |
| 2003 | 0 | 11 | වාහන | 8,000,000 | 2,000,000 | 10,000,000 | 8,911,034 | 1,088,966 |
| | | | <u>මූලධන වත්කම් අත්පත් කර ගැනීම</u> | | | | | |
| 2101 | 0 | 11 | වාහන | - | 10,700,000 | 10,700,000 | 10,211,859 | 488,141 |
| 2102 | 0 | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 2,500,000 | 7,000,000 | 9,500,000 | 8,987,183 | 512,817 |
| 2103 | 0 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 5,000,000 | 3,000,000 | 8,000,000 | 7,989,644 | 10,356<br>204,902 |
| 2104 | 0 | 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 5,000,000 | (4,300,000) | 700,000 | 495,098 | |
| 2201 | 0 | 11 | රණවිරු ගම්මාන වැඩසටහන | - | 20,000,000 | 20,000,000 | 58,534 | 19,941,466 |
| | | | <u>මානව සම්පත් සංවර්ධනය</u> | | | | | |
| 2401 | 0 | 11 | දැනුම වර්ධනය හා ආයතන සංවර්ධනය | 1,000,000 | 800,000 | 1,800,000 | 1,157,035 | 642,965 |
| | | | <u>වෙනත් මූලධන වියදම්</u> | | | | | |
| 2502 | 0 | 11 | වෙනත් ආයෝජන | 2,261,047,000 | 2,906,200,000 | 5,167,247,000 | 4,868,291,735 | 298,955,265 |
| | | | එකතුව | 2,288,447,000 | 2,958,900,000 | 5,247,347,000 | 4,921,449,654 | 325,897,346 |

# <u>ව්‍යාපෘති අනුව මූලධන වියදම්</u>

වියදම් ශීර්ෂ අංකය : 103 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

වැඩ සටහන් අංකය හා නාමය : 02 සංවර්ධන වැඩසටහන් ව්‍යාපෘති අංකය හා නාමය : 09 යටිතල පහසුකම් සංවර්ධනය

| වැය විෂය අංකය | අයිතම අංකය | මූල්‍යාකාරය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) මු.රෙ.66,69 අනුව මාරු කිරීම් පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (3-4) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | <u>මූලධන වියදම්</u> | | | | | |
| 2201 | 1 | 11 | ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක සේවා විශ්ව විද්‍යාලය | 500,000,000 | - | 500,000,000 | 450,963,000 | 49,037,000 |
| 2201 | 2 | 11 | ජාතික අන්තරායකර ඖෂධ මණ්ඩලය | 25,000,000 | - | 25,000,000 | 18,400,000 | 6,600,000 |
| 2201 | 3 | 11 | ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය | 175,000,000 | - | 175,000,000 | 173,490,152 | 1,509,848 |
| 2201 | 4 | 11 | රණවිරු සේවා අධිකාරිය | 1,000,000 | - | 1,000,000 | - | 1,000,000 |
| 2502 | 5 | 11 | රාජ්‍ය නොවන සංවිධාන සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය | 1,000,000 | - | 1,000,000 | 100,000 | 900,000 |
| 2201 | 6 | 11 | නාගරික සංවර්ධන අධිකාරිය | 1,500,000,000 | (525,000,000) | 975,000,000 | 718,830,000 | 256,170,000 |
| 2201 | 7 | 11 | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | 200,000,000 | 825,000,000 | 1,025,000,000 | 1,024,999,000 | 1,000 |
| 2502 | 9 | | හම්බන්තොට ජාතන්තර සම්මන්ත්‍රණ ශාලාව | | | | | |
| | | 17 | | 2,000,000,000 | - | 2,000,000,000 | 1,600,000,000 | 400,000,000 |
| 2502 | 10 | | කොළඹ අග නගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | | | | | |
| | | 12 | | 4,000,000,000 | - | 4,000,000,000 | 2,114,479,497 | 1,885,520,503 |
| | | 17 | | 900,000,000 | - | 900,000,000 | 413,311,774 | 486,688,226 |
| 2502 | 11 | 11 | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය | 470,000,000 | - | 470,000,000 | 88,352,673 | 381,647,327 |
| 2502 | 12 | | මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය | | | | | |
| | | 12 | | 400,000,000 | - | 400,000,000 | 32,902,631 | 367,097,369 |
| | | 17 | | 100,000,000 | (2,200,000) | 97,800,000 | 54,000,000 | 43,800,000 |
| 2502 | 13 | 11 | හතරලියද්ද නගර සංවර්ධන ව්‍යාපෘතිය | 90,000,000 | - | 90,000,000 | 65,000,000 | 25,000,000 |
| 2502 | 14 | 11 | දැයට කිරුළ සංවර්ධන වැඩ සටහන | 200,000,000 | 50,000,000 | 250,000,000 | 193,123,811 | 56,876,189 |
| 2502 | 15 | 12 | ගම්පහ පරිපාලන සංකීර්ණය | 150,000,000 | - | 150,000,000 | - | 150,000,000 |
| 2502 | 16 | 12 | නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශ ගංවතුර ආරක්ෂා කිරීම | 1,400,000,000 | - | 1,400,000,000 | - | 1,400,000,000 |
| | | 17 | | 400,000,000 | - | 400,000,000 | 400,000,000 | - |
| 2502 | 17 | 13 | මහත්මා ගාන්ධි කේන්ද්‍රය ගොඩනැගීම | 84,000,000 | - | 84,000,000 | - | 84,000,000 |
| 2502 | 18 | 11 | අගනගරය ආශ්‍රිත නාගරික ජනතාවගේ සංවර්ධනය පිළිබඳ ශක්‍යතා අධ්‍යනය | 15,000,000 | - | 15,000,000 | - | 15,000,000 |
| | | 17 | | - | 2,200,000 | 2,200,000 | 2,138,192 | 61,808 |
| | | | **එකතුව** | **12,611,000,000** | **350,000,000** | **12,961,000,000** | **7,350,090,730** | **5,610,909,270** |

# වැයපෘති අනුව පුනරාවර්තන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 103 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් වැඩසටහන්

| | (1) | (2) | (3) | (4) | (5) | (6) |
|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති අංකය / නම, පුද්ගලික පඩිනඩි සහ සියළුම ව්‍යාපෘති සඳහා අනෙකුත් වියදම් | අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | මු.රෙ.66,69 අනුව මාරු කිරීම් | මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) | මුළු වියදම් | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම් (4-5) |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ව්‍යාපෘති අංකය. 01 අමාත්‍ය කාර්යාලය | | | | | | |
| පුද්ගල පඩිනඩි | 2,650,000 | - | - | 2,650,000 | 1,904,990 | 745,010 |
| අනෙකුත් වියදම් | 8,810,000 | - | (5,191,193) | 3,618,807 | 2,952,858 | 665,949 |
| **උප එකතුව** | 11,460,000 | - | (5,191,193) | 6,268,807 | 4,857,848 | 1,410,959 |
| ව්‍යාපෘති අංකය. 02 පරිපාලන සහ ආයතන සේවා | | | | | | |
| පුද්ගල පඩිනඩි | 240,600,000 | 2,150,000 | 2,971,371 | 245,721,371 | 228,250,695 | 17,470,676 |
| අනෙකුත් වියදම් | 6,723,290,000 | 13,700,000 | (3,332,859,099) | 3,404,130,901 | 2,144,003,014 | 1,260,127,887 |
| **උප එකතුව** | 6,963,890,000 | 15,850,000 | (3,329,887,727) | 3,649,852,272 | 2,372,253,709 | 1,277,598,563 |
| ව්‍යාපෘති අංකය. 03 රාජ්‍ය බුද්ධි සේවය | | | | | | |
| පුද්ගල පඩිනඩි | 446,295,000 | - | 119,000,000 | 565,295,000 | 545,627,567 | 19,667,433 |
| අනෙකුත් වියදම් | 225,520,000 | - | 71,305,110 | 296,825,110 | 272,761,088 | 24,064,021 |
| **උප එකතුව** | 671,815,000 | - | 190,305,110 | 862,120,110 | 818,388,655 | 43,731,454 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති අංකය. 04 ජාතික ශිෂ්‍ය භට බලකාය | | | | | | |
| පුද්ගල පඩිනඩි | 86,690,000 | - | 750,000 | 87,440,000 | 79,952,908 | 7,487,092 |
| අනෙකුත් වියදම් | 280,340,000 | - | (16,271,000) | 264,069,000 | 128,567,630 | 135,501,370 |
| **උප එකතුව** | 367,030,000 | - | (15,521,000) | 351,509,000 | 208,520,538 | 142,988,462 |
| ව්‍යාපෘති අංකය. 05 පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය | | | | | | |
| පුද්ගල පඩිනඩි | - | - | - | - | - | - |
| අනෙකුත් වියදම් | 8,500,000 | - | 300,000 | 8,800,000 | 7,141,591 | 1,658,409 |
| **උප එකතුව** | 8,500,000 | - | 300,000 | 8,800,000 | 7,141,591 | 1,658,409 |
| ව්‍යාපෘති අංකය. 06 ජාතික ආරක්ෂාව සඳහා වූ මාධ්‍ය මධ්‍යස්ථානය | | | | | | |
| පුද්ගල පඩිනඩි | 5,460,000 | - | - | 5,460,000 | 4,203,350 | 1,256,650 |
| අනෙකුත් වියදම් | 9,630,000 | 500,000 | 300,000 | 10,430,000 | 8,961,428 | 1,468,572 |
| **උප එකතුව** | 15,090,000 | 500,000 | 300,000 | 15,890,000 | 13,164,778 | 2,725,222 |
| ව්‍යාපෘති අංකය. 07 ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය | | | | | | |
| පුද්ගල පඩිනඩි | - | - | - | - | - | - |
| අනෙකුත් වියදම් | 44,080,000 | 202,000,000 | 8,494,000 | 254,574,000 | 142,249,186 | 112,324,814 |
| **උප එකතුව** | 44,080,000 | 202,000,000 | 8,494,000 | 254,574,000 | 142,249,186 | 112,324,814 |
| ව්‍යාපෘති අංකය. 08 විශේෂ කාර්ය බලකාය | | | | | | |
| පුද්ගල පඩිනඩි | 3,102,800,000 | | 216,971,811 | 3,319,771,811 | 3,319,292,785 | 479,026 |
| අනෙකුත් වියදම් | 1,720,550,000 | | (39,071,000) | 1,681,479,000 | 1,583,503,663 | 97,975,337 |
| **උප එකතුව** | 4,823,350,000 | - | 177,900,811 | 5,001,250,811 | 4,902,796,448 | 98,454,363 |
| **මුළු එකතුව** | **12,905,215,000** | **218,350,000** | **(2,973,300,000)** | **10,150,265,000** | **8,469,372,753** | **1,680,892,247** |

## වයාපෘති අනුව පුනරාවර්තන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 103 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

වැඩ සටහන් අංකය හා නාමය : 01 සංවර්ධන වැඩසටහන්

| වයාපෘති අංකය / නම, පුද්ගලික පඩිනඩි සහ සියළුම වයාපෘති සඳහා අනෙකුත් වියදම් | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ.66,69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම් | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම් (4-5) |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වයාපෘති අංකය. 09 යටිතල පහසුකම් සංවර්ධනය | | | | | | |
| පුද්ගල පඩිනඩි | | | | | | |
| අනෙකුත් වියදම් | 692,500,000 | 24,000,000 | - | 716,500,000 | 700,819,498 | 15,680,502 |
| **උප එකතුව** | 692,500,000 | 24,000,000 | - | 716,500,000 | 700,819,498 | 15,680,502 |
| වයාපෘති අංකය | | | | | | |
| අනෙකුත් වියදම් | | | | | | |
| **උප එකතුව** | 692,500,000 | 24,000,000 | 0 | 716,500,000 | 700,819,498 | 15,680,502 |

# 7.2 සත්තද්ධ හමුද හා පොලිස් සුභසාධන අංශය



මව්බිමේ ඒකීයභාවය හා භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් තම දිවි පරදුවට තබා සටන් කළ ත්‍රිවිධ හමුදා, පොලිස් හා සිවිල් ආරක්ෂක සේවයේ රණවිරුවන් හට ගෞරවනීය ලෙස ජීවත්වන්නට අවැසි පහසුකම් සැලසීම අපගේ පරමාර්ථයයි.

**කාර්ය භාරයන් :**

- ඉඩම් නොමැති රණවිරුවන්ට නිවාස ඉදිකර ගැනීම සඳහා ඉඩම් කොටස් ලබාදීම.
- රණවිරුවන්ගේ දරුවන් රජයේ පාසල් වෙත ඇතුලත් කිරීමේදී පැන නගින ගැටළුකාරී තත්ත්වයන් වෙනුවෙන් කටයුතු කිරීම.
- රණවිරුවන්ගේ කලත්‍රයන් හට රාජ්‍ය සේවයේ ස්ථාන මාරු ලබා ගැනීමට සහන සැලසීම.
- රණවිරුවන්ගේ ඉඩම්වලට අදාල ගැටළුකාරී තත්වයන් විසඳා ගැනීමට සහය වීම.
- රණවිරුවන් වෙනුවෙන් සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම




අත්තනගල්ල මීවිටිගම්මන ප්‍රදේශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම



2013 දැයට කිරුළ ප්‍රදර්ශනයේදී අම්පාර රණවිරු දරුවන්ට පාසල් උපකරණ බෙදාදීම.



හැඳල, හේකිත්ත රණවිරු සම්පත් කේන්ද්‍රය විවෘත කිරීම



මතුගම ප්‍රදේශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම

මූල්‍ය තොරතුරු

| අංකය | ක්‍රියාකාරකම | වියදම ඇස්තමේන්තු (රු.මිලියන/දහස්) | ප්‍රගතිය (රු.මිලියන/දහස්) | |
|---|---|---|---|---|
| 1 | හැඳල, හේකිත්ත ප්‍රදේශයේ රණවිරු සම්පත් කේන්ද්‍රය ඉදිකිරීම. | රු.මිලියන 68 (පළමු අදියර සඳහා) , රු.මිලියන 90 (දෙවැනි අදියර සඳහා) | මූල්‍ය | පළමු අදියර සඳහා වෙන්කළ මුදලින් එම අදියරේ කටයුතු අවසන් කර ඇත. |
| | | | භෞතික | 2013.05.24 දින ආරක්ෂක ලේකම්තුමන් විසින් පළමු අදියර විවෘත කරන ලදී. දෙවැනි අදියර ආරම්භ කිරීමට මුදල් ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත. |
| 2 | කළුතර, මතුගම ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | රු.496,990.00 | මූල්‍ය | මෙම හේන්පිට ග්‍රාම නිලධාරි වසමේ ඉඩම ශුද්ධ පවිත්‍ර කිරීමට ඇස්තමේන්තුගත මුදල ප්‍රා.ලේ. වෙත මුදාහරින ලෙස ප්‍රධාන ගණකාධිකාරි වෙත දන්වා ඇත. |
| | | | භෞතික | මෙම ප්‍රදේශයෙන් රණවිරුවන් සඳහා ඉඩම් පහක් වෙන්කර ඇති අතර ඉන් එක් ඉඩමක් දැනටමත් බෙදාදී ඇති අතර අනෙකුත් ඉඩම් බෙදාදීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් ඇත. |
| 3 | කළුතර, බේරුවල ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | මෙම ප්‍රදේශයෙන් රණවිරුවන් සඳහා ඉඩම් දෙකක් වෙන්කර ඇති අතර ඉඩම් කච්චේරි සඳහා නිර්දේශිත රණවිරු ඉඩම් අයදුම්පත් ප්‍රා.ලේ. වෙත යොමුකර ඇත. |
| 4 | ගාල්ල, නාගොඩ ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | ඉඩම් කොටස් ලබාදීම සඳහා මූලික සුදුසුකම් ලැබූ රණවිරුවන් 28 දෙනෙකු තෝරාගෙන ඇත. |
| 5 | අනුරාධපුර, ගල්නෑව ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | ඉඩම් කොටස් ලබාදීම සඳහා නිර්දේශිත රණවිරු ඉඩම් අයදුම්පත් ප්‍රා.ලේ. වෙත යොමුකර ඇත. |
| 6 | අනුරාධපුර, මහවිලච්චිය ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | පර්චස් 20 බැගින් ඉඩම් කොටස් කරන ලද කට්ටි කැඩීමේ සැලැස්මක් සකස් කරවන ලෙස ප්‍රා.ලේ. වෙත දන්වා ඇති අතර මැනුම් නියෝග නිකුත් කර ඇත. |
| 7 | අනුරාධපුර, පදවිය ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | පර්චස් 20 බැගින් ඉඩම් කොටස් කරන ලද කට්ටි කැඩීමේ සැලැස්මක් සකස් කරවන ලෙස ප්‍රා.ලේ. වෙත දන්වා ඇති අතර මැනුම් නියෝග නිකුත් කර ඇත. |
| 8 | අනුරාධපුර, පලාගල ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | කට්ටි කැඩීමේ සැලැස්මක් සකස් කරන ලෙස ප්‍රා.ලේ. මැනුම් නියෝග නිකුත් කර ඇති අතර යුධ හමුදා මිනින්දෝරුවරයකු වෙතින් මැනුම් කර ගැනීමට අනුමැතිය මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 9 | අනුරාධපුර, ගලෙන්බිඳුණුවැව ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | කට්ටි සැලැස්ම සකස් කර ඇති අතර යුධ හමුදා මිනින්දෝරුවරයකු වෙතින් මායිම් ගල් යොදා ගැනීමට අනුමැතිය මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇත. ඉඩම් කොටස් ලබදීමට සුදුසු රණවිරුවන්ගෙන් අයදුම්පත් කැඳවා ඇත. |
| 10 | පොළොන්නරුව, ඇළහැර ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | මෙම ඉඩමේ ඉඩම් කොටස්වල මීට ප්‍රථමයෙන් යුධ හමුදාව මගින් රණවිරුවන් පදිංචි කර ඇති අතර හිස්ව ඇති බිම් කොටස් පිළිබඳව යුධ හමුදාව වෙතින් විමසා ඇත. |
| 11 | පොළොන්නරුව, ලංකාපුර ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | ඉඩම් කොටස් ලබා ගැනීමට අයදුම්කරන රණවිරුවන්ගෙන් අයදුම්පත් කැඳවා මෙම අංශයට යොමුකරන ලෙස ප්‍රා.ලේ. වෙත දන්වා ඇත. |
| 12 | කෑගල්ල, වරකාපොල ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | මෙම ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු ප්‍රා.ලේ. විසින් ඉටුකරමින් ඇත. |
| 13 | කෑගල්ල, යටියන්තොට ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | ඉඩම් කොටස් ලබා ගැනීමට රණවිරුවන් විසින් යොමුකර ඇති අයදුම්පත් නිර්දේශ කර ප්‍රා.ලේ. වෙත යවා ඇත. |
| 14 | කෑගල්ල, කෑගල්ල ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | මෙම ඉඩම බෙරගල යුධ හමුදා කඳවුරට වෙන්කර ඇති ඉඩමක් වන අතර ඉන් කොටසක් රණවිරුවන්ට බෙදාදීමට යුධ හමුදාව අනුමැතිය ලබා දී ඇති අතර ඉදිරි කටයුතු ප්‍රා.ලේ. සමග සම්බන්ධව සිදුකරමින් ඇත. |
| 15 | මාතලේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | රු.207,460.00 | මූල්‍ය | මාර්ග සකස් කිරීම සඳහා වන ඇස්තමේන්තුගත වියදම ත්‍රිවිධ හමුදා, පොලිස් හා සිවිල් ආරක්ෂක යන සන්නද්ධ සේවා මගින් යුධ හමුදාව වෙත ලබාදීමෙන් පසු අදාල කාර්යය ඉටුකර ඇත. |
| | | | භෞතික | මෙම ඉඩමේ මාර්ග පද්ධතිය කපා සකස් කර ඇති අතර ඉඩම් කච්චේරි සඳහා නිර්දේශිත රණවිරු ඉඩම් අයදුම්පත් ප්‍රා.ලේ. වෙත යොමුකර ඇත. |
| 16 | මාතලේ, ලග්ගල පල්ලෙගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | ඉඩම් කොටස් ලබා ගැනීමට අයදුම්කරන රණවිරුවන්ගෙන් අයදුම්පත් කැඳවා නිර්දේශය සඳහා මෙම අංශයට යොමුකර ඇත. |
| 17 | මහනුවර, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩමක් රණවිරුවන්ට ලබාදීම. | රු.215,437,40 | මූල්‍ය | අදාල මැනුම සඳහා ඇස්තමේන්තුගත මුදල මැනුම සිදුකළ මිනින්දෝරුවරිය වෙත ප්‍රධාන ගණකාධිකාරි විසින් ලබා දී ඇති අතර මැනුම සිදුකර ඇත. |
| | | | භෞතික | මෙම ඉඩම සඳහා පාරිසරික අනුමැතියක් ලබාගත යුතු බැවින් ඊට අදාල අයදුම්පත සම්පූර්ණ කර මහනුවර මධ්‍යම පරිසර අධිකාරිය වෙත යොමුකර ඇත. සමෝච්ඡ රේඛා මැනුමට අනුව කොටස් කර බෙදාදීමට සුදුසු ඉඩම් ප්‍රමාණය සඳහා කට්ටි කැඩීමේ සැලැස්මක් සකස් කරවන ලෙස මහනුවර දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය වෙත දන්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 18 | නුවරඑළිය, අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | ඉඩම් කොටස් ලබා ගැනීමට රණවිරුවන් විසින් යොමුකර ඇති අයදුම්පත් නිර්දේශ කර ප්‍රා.ලේ. වෙත යවා ඇත. |
| 19 | කුරුණෑගල, ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | ඉඩම් කච්චේරි මගින් රණවිරුවන් තෝරාගෙන ඇති අතර ඉඩම් කොටස් ප්‍රමාණයට තරම් ඉල්ලුම්කරුවන් නොමැති හෙයින් නැවත කච්චේරියක් සඳහා ගැසට් නිවේදන නිකුත් කිරීමට නියමිතය. |
| 20 | කුරුණෑගල, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | කට්ටි කැඩීමේ සැලැස්මක් සකස් කරන ලෙස ප්‍රා.ලේ. මැනුම් නියෝග නිකුත් කර ඇති අතර යුධ හමුදා මිනින්දෝරුවරයකු වෙතින් මැනුම් කර ගැනීමට අනුමැතිය මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇත. |
| 21 | කුරුණෑගල, කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | රු.267,350.64 | මූල්‍ය | ඇස්තමේන්තුගත මුදල ප්‍රා.ලේ. වෙත මුදාහරින ලෙස ප්‍රධාන ගණකාධිකාරි වෙත දන්වා ඇත. |
| | | | භෞතික | ඉඩම් කොටස් ලබදීමට සුදුසු රණවිරුවන්ගෙන් අයදුම්පත් කැඳවා ඇත. යුධ හමුදා මිනින්දෝරුවරයකු වෙතින් මායිම් ගල් යොදා ගැනීමට අනුමැතිය මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇත. |
| 22 | කුරුණෑගල, නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | ඉඩම් කච්චේරි මගින් තෝරාගෙන ඇති රණවිරු නාම ලේඛනය නිර්දේශ ලබාගැනීමට මෙම අංශයට යොමුකර ඇති අතර අදාල නිර්දේශ ප්‍රා.ලේ. වෙත යොමුකර ඇත. |
| 23 | පුත්තලම, කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | ඉඩමේ භූමිය සකස් කිරීම සඳහා වන වියදම ඇස්තමේන්තු කර දන්වන ලෙස ප්‍රා.ලේ. වෙත දන්වා යවා ඇත. ඉඩම් කච්චේරිය සඳහා නිර්දේශිත ඉඩම් අයදුම්පත් ප්‍රා.ලේ. වෙත යොමුකර ඇත. |
| 24 | පුත්තලම, කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | මෙම ඉඩම් කොටස රණවිරුවන් වෙත බෙදාදීම සඳහා එකඟතාවය ප්‍රා.ලේ. විසින් ඉඩම් අමාත්‍යාංශයෙන් විමසා ඇත. |
| 25 | පුත්තලම, ආණමඩුව , ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | මෙම ඉඩම සඳහා කට්ටි කැඩීමේ සැලැස්මක් සකස් කරවන මෙන් ප්‍රා.ලේ. වෙත දන්වා ඇත. |
| 26 | පුත්තලම, නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | මෙම ඉඩම රණවිරුවන්ට බෙදාදීමට යෝග්‍යදැයි නිරීක්ෂණය කර ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිතය. |
| 27 | බදුල්ල, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | ඉඩම් කොටස් ලබාදීමට සුදුසු 24 රණවිරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කර ඇති අතර කච්චේරි පැවැත්වීමට සූදානම් කරමින් ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 28 | අම්පාර, උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | ඉඩම් කච්චේරිය සඳහා නිර්දේශිත ඉඩම් අයදුම්පත් ප්‍රා.ලේ. වෙත යොමුකර ඇත. |
| 29 | අම්පාර, අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | රණවිරුවන්ට බෙදාදීමට හැකියාව ඇති ඉඩම් ප්‍රමාණය ප්‍රා.ලේ. විසින් මැනුම් අධිකාරි වෙතින් විමසා ඇත. |
| 30 | අම්පාර, දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | මෙම ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වූවක් බැවින් එහි අනුමැතිය ඉල්ලා ඇත. |
| 31 | අම්පාර, ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | මෙම ඉඩම සඳහා කට්ටි කැඩීමේ සැලැස්මක් සකස් කරවන මෙන් ප්‍රා.ලේ. වෙත දන්වා ඇත. |
| 32 | අම්පාර, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | - | භෞතික | සකස් කර ඇති කට්ටි කැඩීමේ සැලැස්මට අනුව මායිම් සලකුණු කර දෙන ලෙස ප්‍රා.ලේ. විසින් මැනුම් අධිකාරි වෙතින් ඉල්ලා ඇත. ඉඩම් කච්චේරිය සඳහා නිර්දේශිත ඉඩම් අයදුම්පත් ප්‍රා.ලේ. වෙත යොමුකර ඇත. |
| 33 | රත්නපුර, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් රණවිරුවන්ට ඉඩම් ලබාදීම. | -` | භෞතික | ඉඩම් කොටස් 40 සඳහා කච්චේරියක් මගින් රණවිරුවන් 69 දෙනෙකු මූලික සුදුසුකම් ලබා ඇති අතර එයින් ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව ඉඩම් කොටස් ලබාදීමට නියමිතය. |
| 34 | පිටකෝට්ටේ පදිංචි විශ්‍රාමික සිවිල් ඉංජිනේරු ඩී.එම්.එස්. විජයසිංහ මහතා විසින් පරිත්‍යාග කරන ලද අත්තනගල්ල, මීවිටිගම්මන ප්‍රදේශයේ ඉඩම රණවිරුවන්ට බෙදාදීම. | - | භෞතික | මෙම ඉඩම පර්චස් 104 කින් යුතු රුපියල් මිලියන 10 කට වඩා වැඩි වටිනාකමකින් යුතු ඉඩමක් වන අතර 2013.01.04 දින ආරක්ෂක ලේකම්තුමන් විසින් රණවිරුවන් 09 දෙනෙකු වෙත ඉඩම් ඔප්පු පිරිනමන ලදී. |

**2014 වසරේ ඉදිරි දැක්ම :**

- අතිගරු ජනාධිපතිතුමන්ගේ "මහින්ද චින්තන" වැඩපිළිවෙල අනුව දිවයින පුරා රණවිරුවන් සඳහා ඉඩම් කොටස් 10000 ක් ලබාදීම. (2012-2016 වසර දක්වා)
- රණවිරුවන්ට බෙදාදෙනු ලබන ඉඩම්වල නිවාස ඉදිකර ගැනීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් "විරු උපහාර" ණය මුදල් ලබාදීමට අවශ්‍ය කටයුතු සැලසීම.
- විශ්‍රාමික රණවිරුවන් සඳහා රණවිරු දිවි නැගුම යටතේ පැන් ඒෂියා බැංකුව මගින් නිවාස තනා ගැනීමට සහ සුළු ව්‍යාපාර ඇරඹීමට ණය පහසුකම් ලබාදීමට අවශ්‍ය කටයුතු සැලසීම.
- හැඳල, හේකිත්ත ප්‍රදේශයේ ඉදිකර ඇති රණවිරු සම්පත් කේන්ද්‍රයේ දෙවන අදියරේ ඉදිකිරීම් කටයුතු සිදුකිරීම.



# 7.3 “අපි වෙනුවෙන් අපි” නිවාස ව්‍යාපෘතිය

යුද්ධයේදී මියගිය, අතුරුදහන්, ආබාධිත හා සේවයෙහි යෙදී සිටින ත්‍රිවිධ හමුදාවේ රණවිරුවන් වෙනුවෙන් **“අපි වෙනුවෙන් අපි ”** අරමුදල මඟින් නිවාස ඉදිකරදීමේ ව්‍යාපෘතියක් **අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ** මැතිතුමාගේ සංකල්පයක් මත රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් **ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ** මුලිකත්වයෙන් දිපව්‍යාප්තව ක්‍රියාත්මක කරනු ලබන මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය පහසුකම් **“අපි වෙනුවෙන් අපි ”** අරමුදල මඟින් ලබා දෙන අතර ත්‍රිවිධ හමුදාවේ ශ්‍රම දායකත්වයෙන් මෙම නිවාස ඉදිකරනු ලැබේ.

මෙම නිවාස ව්‍යාපෘතිය දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වන අතර රාජ්‍ය ආරක්ෂක ලේකම්තුමාගේ සෘජු මෙහයවීම හා මඟ පෙන්වීම යටතේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයීය සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනි අයෝමා රාජපක්ෂ මැතිනියගේ අධීක්ෂණය යටතේ ක්‍රියාවට නැංවෙන ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ ඉඩමක් හිමි නිවසක් තනාගැනිමට ආර්ථික වශයෙන් හැකියාවක් නොමැති රණවිරුවන් හට තම ඉඩමෙහි හිසට සෙවනක් ලබාදීම වේ. මෙමඟින් මෙරට හා විදෙස්හි සිටින සංවේදි ජනතාවගේ මූල්‍යාධාරයෙන් ගොඩනැගුණු **“අපි වෙනුවෙන් අපි ”** අරමුදලේ මූලික පරමාර්ථය වන රණවිරු සුභසාධනය මුදුන් පමුණුවා ගැනිමට හැකියාව ලැබෙන අතරම ත්‍රිවිධ හමුදාවේ සෑම රණවිරුවකුටම හිසට සෙවනක් ලබා දීමටද හැකියාව ලැබිම ආරක්ෂක ලේකම්තුමාගේ මෙන්ම මෙරට කෘතවේදි ජනතාවගේ බලාපොරොත්තු ඉටු විමක් වනු නොඅනුමානය.

**අරමුණු හා පරමාර්ථ**

- සන්නද්ධ සේවාවල සාමාජිකයන් හට නිවාස ඉදිකිරීම පිණිස මූල්‍යමය සහය ලබාදීම සඳහා යෝජනා ක්‍රම ඇති කිරීම.
- සන්නද්ධ හමුදා සාමාජිකයන්හට නිවාස පහසුකම් ලබා ගැනීම සඳහා ආධාර ලබාදීම.
- සන්නද්ධ හමුදා සාමාජිකයන් විසින් මූල්‍ය ආයතන වලින් ණය ලබා ගැනීම සඳහා සහ එම ණය ගෙවීම සඳහා එම සන්නද්ධ හමුදා සාමාජිකයන්හට ආධාර ලබාදීම සඳහා විධිවිධාන සැලැස්වීම.
- සන්නද්ධ හමුදා සාමාජිකයෙකු මිය යන අවස්ථාවේදී හෝ තුවාල සිදුවන අවස්ථාවකදී ණය ආපසු ගෙවනු ලැබීම සහතික කර ගැනීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කිරීම.





“අපි වෙනුවෙන් අපි” අරමුදලේ මුලා ප්‍රතිපාදන මත රණවිරුවන් සඳහා පසු ගිය වර්ෂය තුල නිවාස 209 ක් පහත දිස්ත්‍රික්ක 8 හි සාදා නිමකර අදාල රණවිරුවන් වෙත ලබා දීම අතිගරු ජනාධිපතිතුමන් අතින් එම දිස්ත්‍රික්කයන් හිදි පහත පරිදි සිදුකරන ලදී.

| දිස්ත්‍රික්කය | ලබා දුන් දිනය | අදාල හමුදාව | | | | | | | | | | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ශ්‍රී ලංකා යුධ හමුදාව | | | | ශ්‍රී ලංකා නාවික හමුදාව | | | | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | | | | |
| | | මියගිය | ආබාධිත | *සේ.නි. | මුළු ගණන | මියගිය | ආබාධිත | *සේ.නි. | මුළු ගණන | මියගිය | ආබාධිත | *සේ.නි. | මුළු ගණන | |
| රත්නපුර | 02/03/2013 | 4 | 7 | 46 | **57** | 1 | 1 | 22 | **24** | 1 | - | 13 | **14** | **95** |
| මාතලේ | 03/06/2013 | 4 | 13 | 52 | **69** | 1 | - | 20 | **21** | - | - | 10 | **10** | **100** |
| නුවරඑළිය | 18/08/2013 | 1 | 9 | 47 | **57** | - | 2 | 25 | **27** | 1 | 1 | 16 | **18** | **102** |

*සේ.නි. - සේවයේ නියුතු

ඉහත දිස්ත්‍රික්කයන්ට අමතරව පහත දිස්ත්‍රික්කයන්හි නිවාස ඉදිකිරීම් කටයුතු දැනටමත් ආරම්භ කර යුධ, නාවික හා ගුවන් යන ත්‍රිවිධ හමුදාවන්හි ශ්‍රම දායකත්වයෙන් දක්වා ඇති ප්‍රමාණයන්ගෙන් ඉදිකිරීම් කටයතු සිදුකර ඇත.

| | |
|---|---|
| කොළඹ | 115 |
| පුත්තලම | 100 |
| කුරුණෑගල (දෙවන අදියර) | 125 |
| අනුරාධපුර | 100 |

ඉහත දිස්ත්‍රික්කයන්ට අමතරව අනුරාධපුර, පුත්තලම, වව්නියාව යන දිස්ත්‍රික්කයන්හි එක් දිස්ත්‍රික්කයක නිවාස 100 කට නොඅඩු ප්‍රමාණයක් ඉදිකිරීමට අපේක්ෂිතය.

මෙරට වෙලාගත් කුරිරු ත්‍රස්තවාදය නිමාකර දේශය නිදහස් කරගත් ඒ උත්තම ත්‍රිවිධ හමුදා රණවිරුවන් කල උදාර කාර්යට කලගුණ සලකනු වස් ඉදිවන මෙම කෘතවේදිත්වයේ නිවහනේ සෙවන ලැබීම ඔවුන්ගේ අභිමානය නැංවීමට හේතුවනු ඇත.









## 7.4 " මිහිඳු සෙත් මැදුර " ව්‍යාපෘතිය

**හැඳින්වීම.**

රණක්ෂිතයට පත් රණවිරුවන් 50 දෙනෙකු පමණ පූර්ණ කාලීනව නේවාසික පහසුකම් ලබා දෙන රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ආයතනයකි.

**දැක්ම**

ශාරීරිකව අබාධිත වූ රණවිරුවන්ගේ අභිමානය සහ ප්‍රෞඩත්වය ඔපමට්ටම් කිරීම තුළින් ඔවුන්ව නැවත සමාජයට ප්‍රත්‍යානුකලනය කිරීම.

**මෙහෙවර**

විවේකී සහ යහපත් වූ පරිසරයක ජීවත්වීමට ඉඩ සැලසීම තුළින් අනාගත අභියෝග සඳහා විශ්වාසනීයත්වයෙන් යුක්තව මුහුණ දීම සහතික කරමින් පූර්ණ ලෙස ආබාධිතව සිටින මෙම රණවිරුවන් සිය ළඟම ඥාතීන් සහ සමාජය සමඟ භෞතික, අධ්‍යාත්මික සහ මානසික වශයෙන් සමීප කරමින්, එම රණවිරුවන්ගේ ජීවිතයන් යහපත් කරනු පිණිස සේවය කිරීමය.

**අරමුණු**

- සාමකාමී සහ පහසු ජීවිතයක් ගත කිරීම උදෙසා ඔවුන්ට පහසුකම් සැපයීම.
- මනා ලෙස සංවිධානය කරන ලද වැඩසටහන් ඔස්සේ අධ්‍යාත්මික, සමාජීය, වෛද්‍යමය සහ වෘත්තීමය සහය ලබා දීමෙන් ඔවුන් චිත්ත ධෛර්ය වැඩිදියුණු කර ජීවිතය දෙස නව දෘෂ්ටී කෝණයකින් බැලීමට යොමු කිරීම.
- ශාරීරික ආබාධ හේතුවෙන් ඔවුන් තුළ මතුවන පසුගාමීත්වය මඟ හරවමින් ඔවුන් සමාජයේ කොටසක් ලෙස සලකා ඉගෙන ගැනීමට හා දියුනු වීමට ඉඩ ප්‍රස්තා සලසා දීම.
- සිය පවුල් සාමාජිකයන් හා යහළුවන් සමඟ සමීප සම්බන්ධතා පැවැත්වීමට පහසුකම් සලසා දීම තුළින් ඔවුනගේ සබඳකම් වැඩි දියුණු කිරීමට පියවර ගැනීම.
- ශරීර ශක්තිය නැවත උත්පාදනය කිරීමේ කළමනාකරණ ක්‍රියාවලිය උදෙසා මනා ලෙස පුහුණුව ලත් අත්දැකීම් බහුල කාර්ය මණ්ඩලයක් යොදි ගැනීම.
- ජාත්‍යන්තර න්‍යායන්, තත්වයන් සහ පරිචයන්ට අදාළ වන ලෙස ආයතනය පවත්වාගෙන යාම. මේ ආකාරයෙන් සුභ සාධන කටයුතු සිදු කරන ආයතනයන් වෙත නිදර්ශනයට ගත හැකි ප්‍රමුඛතම ආයතනයක් බවට පත් වීම.





# 7.5 ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය



යුද, නාවික, ගුවන් හමුදාවෙන් හා පොලිස් දෙපාර්තමේන්තුව සිවිල් ආරක්ෂක බළකාය යන ආරක්ෂක සේවාවන්හි කාර්යයන් අධීක්ෂණය කිරීම හා හදිසි අවස්ථා ආපදා මැතිවරණ ප්‍රභූ සංචාර ජාතික වැදගත් කමක් උසුලන සාකච්ඡා සම්මන්ත්‍රණ හෝ උත්සව අවස්ථාවන්හිදී මෙන්ම රටේ සංවර්ධන ක්‍රියාදාමය වෙනුවෙන් සිදුකරන සුවිශේෂිත කාර්යයන්හිදී ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා සිවිල් ආරක්ෂක බළකාය සුදුසු පරිදි යෙදවීම.

**කාර්යභාරයන්**

**සිවිල් සම්බන්ධීකරණ මානුෂීය ක්‍රියාකාරකම්**

- උතුරු පළාත් පාසල් දරු දැරියන් හා දකුණු පළාත් පාසල් දරු දැරියන් අතර සහයෝගීත්වය වර්ධනය කිරීමේ අරමුණින් වාර්ෂිකව පවත්වනු ලබන සැම විජේසිංහ අනුස්මරණ පාපන්දු තරඟාවලිය පැවැත්වීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
- රට තුළ පැතිරෙන්නාවූ ඩෙංගු උවදුර වැළැක්වීම සඳහා ත්‍රිවිධ හමුදාව වෙතින් ලැබිය යුතු හටපිරිස් ලබාදීම සඳහා සම්බන්ධීකරණය කිරීම.
- පාසැල්, රජයේ හා පුද්ගලික ආයතනයන් විසින් සංවිධානය කරනු ලබන ප්‍රදර්ශන සඳහා ත්‍රිවිධ හමුදාව වෙතින් ප්‍රදර්ශන කුටි ලබාදීම සම්බන්ධීකරණය කිරීම.
- දීප ව්‍යාප්තව පවත්වාගෙන යන විවිධ ආගමික උත්සවයන් සඳහා ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සංස්කෘතික කණ්ඩායම් හට පිරිස් සහභාගී කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

**ආරක්ෂාව**

- ශ්‍රී ලංකාව,මාලදිවයින සහ ඉන්දියාව ඒකාබද්ධව එම රටවල් අතර නාවික ආරක්ෂාව පවත්වාගෙන යාම පිළිබඳව සැළසුම් කිරීම හා එහිදී පැවැත්වූ සාකච්ඡාවේ සැළසුම් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත දැනුම් දීම.
- පිදුරුතලාගල කඳුවැටිය ප්‍රදේශය තහනම් ප්‍රදේශයක් බවට පත්කර තිබූ අතර එම තහනම ඉවත් කිරීමෙන් පසු එහි ආරක්ෂක හා පරිපාලන කටයුතු යුද හමුදා අධීක්ෂණය යටතේ තවදුරටත් ඉටුකරන ලෙස හා ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ත්‍රිවිධ හමුදාවන් වෙත දැනුම් දීම.
- 2013.03.01 කල්පිටිය කනදක්කුලිය හමුදා වෙඩි පුහුණු කඳවුරු මායිම් සීමාවේ පදිංචි සිවිල් වැසියන්ගේ ආරක්ෂාව සඳහා එම කඳවුරු භූමිය මායිම්වලට ආරක්ෂක වැටක් ඉදිකිරීම.
- 2013.01.07 බන්ධනාගාර නිළධාරීන් සතු ස්වයංක්‍රීය ගිනි අවි යුද හමුදාව වෙත පවරා ගැනීමෙන් පසු ඔවුන්වෙත ලබාදුන් රිපීටර් අවි හා පතොරොම් තුවක්කු පිළිබඳ දිවයින පුරා පිහිටි බන්ධනාගාර ආවරණය වන පරිදි බන්ධනාගාර නිළධාරීන් සඳහා දෙදින පුහුණුවක් ලබාදීමට කටයුතු කිරීම.
- අ.පො.ස. (උ/පෙළ)/අ.පො.ස. (සා/පෙළ) හා ශිෂ්‍යත්ව විභාගයන් බාධාවකින් තොරව පවත්වා ගෙනයාම සඳහා අවශ්‍ය ආරක්ෂාව ආරක්ෂක අංශ සම්බන්ධීකරණයෙන් යුතුව ලබාදීම.
- 2013 නොවැම්බර් මස 11 වන දින සිට 15 දින දක්වා ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට නියමිත පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවේ ආරක්ෂාව සහ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

**පාඨමාලා/පුහුණුවීම්**

- Staff Talk ඉන්දුනීසියාව වැඩමුළුව - 2013 ජුනි මස සිට 08 සිට 11 දින දක්වා ගලදාරි හෝටලයේදී පැවැත්වීම.
- ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් 2013 සැප්තැම්බර් 10 දින සිට සැප්තැම්බර් 25 වන දින දක්වා අම්පාර ප්‍රදේශයේදී EXERCISE CORMORANT STRIKE යුද අභ්‍යාස තෙවන අදියර පැවැත්වීම සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
- ත්‍රිවිධ හමුදා ජ්‍යෙෂ්ඨ නිළධාරීන් සඳහා 2013.08.12 දින සිට 15 දින දක්වා ඇමරිකාවේදී පැවැත්වීමට නියමිත REGIONAL SEMINAR ON CIVIL MILITARY LEADERSHIP AND COMBATING TERRORISM IN SRI LANKA වැඩමුළුව සඳහා ත්‍රිවිධ හමුදා නිළධාරීන් හට සහභාගිවීමට ඇවැසි කටයුතු සම්පාදනය කිරීම.
- ත්‍රිවිධ හමුදා ජ්‍යෙෂ්ඨ නිළධාරීන් සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයේදී පැවැත්වීමට නියමිත THE COUNTER TERRORISM ARCHITECT PROJECT/CT STORIES -වැඩමුළුව සඳහා ත්‍රිවිධ හමුදා නිළධාරීන් හට සහභාගීවීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ත්‍රිවිධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිළධාරීන් හට පෙර වර්ෂයන්ට වඩා වැඩි සංඛ්‍යාවකට NDC/NDU පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලබාදීමේ කටයුතු සිදුකිරීම.
- Hospitality Management Course – 2013 මාර්තු මස 05 වන දින සිට වසර 03 ක කාලසීමාවක් සඳහා යුද හමුදා නිළධාරීන් 04 දෙනෙකු සහභාගී වන අතර, තත් පාඨමාලාව ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය යටතේ පවත්වනු ලබයි.
- මෙම කාර්යාලය අධීක්ෂණය යටතේ 2013.04.04, 05 සහ 06 යන තෙදින තුළ කොළඹ විශ්ව විද්‍යාලයේදී ත්‍රිවිධ හමුදා නිළධාරීන් සඳහා DIPLOMA IN COUNSELING වැඩමුළුව පැවැත්වීම.
- යුද, නාවික හා ගුවන් හමුදාවේ රාජකාරියේ නිරතව සිට විශ්‍රාම ගනු ලබන සෙසු නිළයින් හට විශ්‍රාම දිවිය යහපත් කර ගැනීම පිණිස රාජ්‍ය ආයතන, හමුදා පුහුණු පාසල් හා පෞද්ගලික ආයතන සමඟ එක් වී විවිධ වෘත්තීය ක්ෂේත්‍රයන් තුල වෘත්තීය පුහුණුවක් ලබාදීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම.

**ආපදා කළමනාකරණය**

- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි අධ්‍යක්ෂ මෙහෙයුම් තනතුර සඳහා අධ්‍යක්ෂවරයෙකු පත්කිරීමට කටයුතු කිරීම.
- මුදවා ගැනීමේ හා සෙවීමේ ඒකක සඳහා පුහුණුව ලබාදීම.
- ශ්‍රී ලංකාව තුළ සිදුවන හදිසි ආපදාවන් හිදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා ත්‍රිවිධ හමුදාවන්ගේ සහාය ලබාගෙන අවතැන් වූවන් වෙනුවෙන් සහන සැලසීමට අවශ්‍ය කටයුතු කිරීම.

**ඉදිකිරීම්**

- රණජයපුර නිවාස ව්‍යාපෘතියේ නිවාස රණවිරුවන් වෙත භාරදීම සඳහා වාරික සින්න ගිවිසුම කෙටුම්පත් කර රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් තුමාගේ අනුමැතිය මත නිවාස ලාභී ත්‍රිවිධ හමුදා සාමාජිකයින් වෙත ලබාදීම.
- රණජයපුර නිවාස ව්‍යාපෘතියේ රුපියල් මිලියන 9.2 ක වටිනාකමින් යුත් පහත දක්වා ඇති යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ / ඉදිකිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
  - නිවාස ව්‍යාපෘතිය වටා අලි වැට ඉදිකර අවසන් කිරීම.
  - රණජයපුර විද්‍යාලයේ පිවිසීමේ දොරටුව මේ වන විට ඉදිකරමින් පවතින අතර රණජයපුර විද්‍යාලය සඳහා ආරක්ෂක මුරකුටියක් ඉදිකිරීම හා රණජයපුර නිවාස ව්‍යාපෘතිය සඳහා සුසාන ශාලාවක් ඉදිකිරීම.

- ක්‍රීඩා පිටියේ ප්‍රේක්ෂකාගාරයේ ඉදිකිරීම් කටයුතු මේ වන විට ඉදිකරමින් පවතී.

- රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශ ලේකම් තුමාගේ උපදෙස් මත ත්‍රිවිධ හමුදාව වෙතින් තෝරාගත් පහත සඳහන් ප්‍රදේශ 03 ක 20 KV ධාරිතාවයෙන් යුතු සූර්ය බලශක්ති බලාගාර 03 ක් ඉදිකිරීමට ඇවැසි ප්‍රාථමික ක්‍රියාමාර්ගයන් සිදුකිරීම.
    - අනුරාධපුර අභිමංසල රණවිරු පුනරුත්ථාපන මධ්‍යස්ථානය
    - නිලාවේලි ප්‍රදේශයේ පිහිටා ඇති විජයබා නාවික හමුදා කඳවුර
    - පාලවි ප්‍රදේශයේ ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර

**2014 ඉදිරි දැක්ම :**

- ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගෙන් ඉදිරිපත් කෙරෙන දුක්ගැනවිලි සැබැඳිව සොයාබලා ඒවාට සුදුසු පරිදි අනුමත චක්‍රලේඛන/ප්‍රතිපාදන මත සහන ලබාදීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් ඇති කිරීම.
- කඩිනම් සංවර්ධන ව්‍යාපෘති අතුරින් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් ඉටු කරනු ලබන ව්‍යාපෘතිවලට එම අමාත්‍යාංශයේ අනුමැතිය මත ත්‍රිවිධ හමුදාවේ, පොලීසිය සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ දායකත්වය ලබාදීම සම්බන්ධීකරණය කිරීම.
- අප රටේ සංස්කෘතික හා ආගමික පුනර්ජීවයක් ලබාදීම සඳහා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් කරගෙන යන වැඩපිළිවෙලට ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ දායකත්වයක් ලබාදීම සම්බන්ධීකරණය කිරීම.
- ආරක්ෂාව, ආපදා සහ විවිධ කටයුතු වලදී මෙතෙක් මෙම කාර්යාලය මගින් ඉටුකරනු ලැබූ සම්බන්ධීකරණ කටයුතු ඉදිරි වර්ෂය තුළ වඩාත් කාර්යක්ෂමව සිදුකිරීමට කටයුතු කිරීම.
- සිවිල් ආයතනයන් සමඟ සම්බන්ධ වී ඉදිරි වර්ෂය තුළ නිළධාරී/සෙසුනිළයින් හට පුහුණු පාඨමාලා කටයුතු සඳහා සම්බන්ධවීමට වැඩි අවස්ථාවක් ලබාදීමට කටයුතු කිරීම.
- රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ අනුමැතිය මත විදේශ හමුදා සමඟ සම්බන්ධවීමෙන් පෙර වර්ෂයට වඩා වැඩි ත්‍රිවිධ හමුදා සාමාජිකයින් ප්‍රමාණයකට විදේශ පුහුණුව/පාඨමාලාවන් ලබාදීමට කටයුතු කිරීම.

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 103 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාතාංශය

වැඩ සටහන් අංකය හා නාමය : 01මෙහෙයුම් වැඩසටහන්

ව්‍යාපෘති අංකය හා නාමය : 07 ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය

| වැය විෂය අංකය | අයිතම් අංකය | මූල්‍යාකරණය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) මු.රෙ.66,69 අනුව මාරු කිරීම් පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (3-4) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | <u>මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම</u> | | | | | |
| 2002 | 0 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 55,000 | - | 55,000 | - | 55,000 |
| 2003 | 0 | 11 | වාහන | 550,000 | - | 550,000 | - | 550,000 |
| | | | | | | | | |
| | | | <u>මූලධන වත්කම් අත්පත් කර ගැනීම</u> | | | | | |
| 2102 | 0 | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 300,000 | 14,800,000 | 15,100,000 | 14,471,662 | 628,338 |
| 2103 | 0 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 300,000 | - | 300,000 | 278,080 | 21,920 |
| | | | | | | | | |
| | | | <u>මානව සම්පත් සංවර්ධනය</u> | | | | | |
